**<u>මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.01.12 දින පැවති මහා සභාවේ වාර්තාවයි.</u>**

2022.01.12 වන දින පෙ.ව. 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

අද දින සභා රැස්වීමට පැමිණ සිටින ඔබ සියළුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ වීමෙන් පසු පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරමි.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

සියලු දෙනාටම මාගේ තෛපොංගල් සුභ පැතුම් පුද කරමින් පසුගිය සභා වාර්තාව පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. පසුගිය සභා වාර්තාව දකින්න ලැබෙන්නේ විහිළුවක් ලෙසටයි. අවුරුදු ගණනාවකට පසුවත් මෙම සභා වාර්තාව මේ විදිහට දකින්න සිදුවීම වේදනාකාරී සිද්ධියක්. ඉන් පළමුවැනි කාරණාව තමයි අපගේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් වන කේ. රාජ්කුමාර්, පී. ආනන්දන්, ඒ. රවීන්ද්‍රරාජා යන මැතිවරුන්ට විදි ලාම්පු සවි කිරීම සඳහා අපගේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාධාක්‍රිෂ්ණන් මැතිතුමා විසින් ප්‍රතිපාදන වෙන්කර ඒ පිළිබඳව සභාවේ සාකච්ඡා කර තිබුණා. නමුත් ඒ ව්‍යාපෘතිය සඳහා අපි තිදෙනාට සභාවේ අනුමැතිය ලබාදුන් බවට සභා වාර්තාවේ සඳහන් වෙනවා. මෙම ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර ඇති නමුත් වාර්තාවේ සඳහන් වන්නේ අප තිදෙනාට මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට අනුමැතිය ලබාදුන් බවටයි. එම ප්‍රතිපාදන අපි තිදෙනාට වෙන් කළ එකක්. මෙය සභාවේ මුදලක් නොවේ. මේ කාරණාව මේ අවස්ථාවේදී ඉතාමත් පැහැදිලිව සඳහන් කිරීමට කැමැත්තෙමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

පසුගිය සභා වාරයේ නොව ඊට පෙර සභා රැස්වීමේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාධාක්‍රිෂ්ණන් මැතිතුමා විසින් වීදි ලාම්පු සවි කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කළ බවට සඳහන් ලිපිය ඉදිරිපත් කරන ලදී. ඉන්පසුව එම ව්‍යාපෘතිය සම්බන්ධව අදාළ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කළයුතු බවට පසුගිය සභා වාරයේදී ඔබතුමා සඳහන් කිරීමට අදාළව පසුගිය මාසයේ සභා වාර්තාව සංශෝධනය කරමින් මෙම කරුණු ඇතුලත් කරලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මම කියලා තිබුණා. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබුණු ලිපියේ ගරු මන්ත්‍රීවරුන් තිදෙනාගේ නම් සඳහන් වෙලා තිබුණා. අපි මගින් මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමට සභාවේ අනුමැතිය අපි ඉල්ලුවේ නැහැ. සභාව මගින් මෙම ව්‍යාපෘතිය ඉටු කිරීමට අනුමැතිය ඉල්ලුවා මිසක් ගරු මන්ත්‍රීවරුන් මගින් ඉටුකිරීමට අනුමැතිය ඉල්ලුවේ නැහැ. පසුගිය සභා වාර්තාව හොඳටම අධ්‍යයනය කළොත් මාගේ කතාවේදී මේ කරුණ ඉතා පැහැදිලිව සඳහන් කරලා තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාධාක්‍රිෂ්ණන් මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ එකී ව්‍යාපෘතිය ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදුන් බවට පසුගිය සභා වාර්තාවේ සඳහන් වෙනවා. ඉන්පසුව ගරු මන්ත්‍රීවරුන් තිදෙනාගේ නම් ඇතුලත් කරන ලෙස ඔබතුමා කල ඉල්ලීමකට අනුව තමයි සංශෝධනය කර එය ඇතුළත් කළේ.

**<u>ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ඒක හරි ගරු සභාපතිතුමියනි, මෙහි සඳහන් වාක්‍ය වැරැදි විදිහට තියෙනවා, කිසිම අවස්ථාවක මෙම තිදෙනාගේ නම් යෝජනා කර ස්ථිර කළේ නැහැ. නම සඳහන් කළෙත් නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නම් සඳහන් කරන ලෙසට ඔබ ඉල්ලා සිටියා.

**<u>ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මම තමයි ඉල්ලුවේ, නමුත් කිසිම අවස්ථාවක සභාව අපගේ නම් සඳහන් කර යෝජනා ස්ථිර කළේ නැහැ නේ? අර්ථය වැරදි විදියට සඳහන් වෙනවා. තවද පසුගිය සභා වාරයේදී විටින් විට විවිධ ප්‍රශ්න පැන නැගෙමින් තිබුණා.

එහිදී එක් අවස්ථාවක සභාව පොදු සභාවක් ලෙසට මාරු කළා. එසේ පොදු සභාවක් ලෙසට මාරු කරනවා නම් සභාව පොදු සභාවක් ලෙස මාරු කිරීමට පෙර සහ පසුව එය යෝජනා ස්ථිර කළ යුතුයි. නමුත් මෙහිදී එහෙම සිදු කළේ නැහැ. ගරු සභාපතිතුමිය විසින් පමණක් පොදු සභාවක් බවට පරිවර්ථනය කරන බවට සඳහන් කළා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
පොදු සභාවක් ලෙස පරිවර්ථනය කරනවා නම් එය යෝජනා ස්ථිර කර සිදුකළ යුතු බවට එම අවස්ථාවේ ගරු මන්ත්‍රී කේ. සුරේෂ්කුමාර් මැතිතුමා පැවසුවා. ඒ අනුව සිදු නොකළ නිසා එම අවස්ථාවේ දී සාකච්ඡා කළ සියලු කරුණු වාර්තාවට ඇතුලත් කළයුතු බවට ඉල්ලා සිටීමට අනුව සාකච්ඡා කල සියළු කරුණු වාර්තාවට ඇතුළත් කර තියෙනවා.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
එසේ නම් නැවත සභාව ආරම්භ කරන බවට ප්‍රකාශ කිරීම සඳහා ඔබ තුමිය අවතීර්ණය වුණේ ඇයි? එසේ නම් පොදු සභාවක් බවට පරිවර්ථනය කළ අවස්ථාවේ දී සාකච්ඡා කළ කරුණු වාර්තාවට ඇතුළත් නොකළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එම කරුණු වාර්තාවට ඇතුළත් කල යුතු බවට ගරු මන්ත්‍රී තුමා පැවසීමෙන් පසුව එය ඇතුළත් නොකර ඉන්නේ කෙසේද?

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
අවසාන වශයෙන් අදහසක් ප්‍රකාශ කිරීමට කැමතියි. පසුගිය සභා වාරයේදී ඉතාමත් පහත් සිදුවීම් ටිකක් සිදුවුණා. ඒ පිළිබඳව අපි සියලු දෙනා අවධානය යොමු කරමිනුයි සිටින්නේ. නමුත් සභා වාර්තාවේ සඳහන් වෙන්නේ එම අවස්ථාවෙන් පසුව සභාව අවසන් කළ බවටයි. නමුත් එම අවස්ථාව අවසන් වනතුරු ගරු සභාපතිතුමිය සභාවේ සිටියා. දෙදෙනෙක් අතර වචන හුවමාරුවක් සිදු වුණා. ගරු උප සභාපති තුමා, ගරු මන්ත්‍රී පී ආනන්දරාජ් මහතාට පහර දීමට උත්සාහ කළ බවත්, ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් මහතා, ගරු උප සභාපති තුමාට පහරදීමට උත්සාහ කළ බවටත්, සභාව සතුටින් විසිර ගිය බවටත් සභා වාර්තාවේ සඳහන් වෙනවා. නමුත් පසුගිය සභා වාරයේදී සිදුවුණේ කුමක්ද කියලා ගරු සභාපතිතුමිය හොදටම දන්නව. එදින සභා වාරය අවසන් කළාද? නැතිනම් කල් තැබුවාද? එසේ නැතිනම් ඊළඟ සභා රැස්වීම සඳහා දිනයක් සඳහන් කළාද? ගරු සභාපතිවරයෙක් සභාපතිගේ ආසනයට යන අවස්ථාවේ පක්ෂපාතීව හෝ පාටපාතිව කිසිම අවස්ථාවක ක්‍රියා නොකළ යුතු බවට ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. සභාවේ යම් කිසි ප්‍රශ්නයක් මතුවුවහොත් අවසන් වනතුරු තමාගේ ආසනයේ සිට ගරු සභාපතිතුමිය සභාව අවසන් වනතුරු එම ආසනයේ සිටිය යුතුයි. නමුත් එදින ගරු සභාපතිතුමිය ඒ වගේ ක්‍රියාත්මක වුණ බවට ඔබගේ හෘද සාක්ෂිය අනුව කතා කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු උප සභාපතිතුමා එදින සභා රැස්වීමේදී ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාවට පක්ෂව කතා කරන අවස්ථාවේදී ගරු මන්ත්‍රී පි. ආනන්දරාජ් මැතිතුමාව අමතමින් මුලා කමිටුවේ දී යම් කාරණාවක් සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවට පවසමින් අනවශ්‍ය වචන භාවිතා කළා. ඉන් පසුව දෙදෙනා අතර තර්කයක් දිග්ගැස්සිලා වීදුරුවක් විසි කළා. මෙය නවත්වන්න කියලා මමත් හැකි තරම්

ඉල්ලා සිටියා. මම මේසයටත් තට්ටු කරලා බැලුවා. සභාපතිවරයෙක්ගේ අණදීමට ගරු කරන්න පුළුවන් මන්ත්‍රීවරුන් වෙන්න ඕන. ඉන්පසුව මම ගරු කේ. රාජ්කුමාර් මන්ත්‍රීතුමාටත් සභාව අවසන් කරන බවට පවසලා සභාව අවසන් කළා. හේතුව එක්තරා අවස්ථාවකින් එහා සභාව ඉදිරියට පවත්වාගෙන යාමට බැරි තත්ත්වයක් උදා වුණා. මෙතැනින් මා සභාව අවසන් කරනවා. ඊළඟ මාසයේ නැවතත් සභාව රැස් කරන බවට පවසා සභාව අවසන් කර, ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා ළඟට ගිහිල්ලා මම එයාට දොස් පැවරුවා. සභාවේ විනීතව හැසිරෙන ලෙසට මම පැවසුවා. මම සභාව අවසන් කර ඉන් පසුව තමයි ආසනයෙන් නැගිට්ටේ. මේ සම්බන්ධ වූ පටිගත කිරීමත් තියෙනවා.

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
සභාව අවසන් කරලා ඉන් පසුව ඔබතුමිය ආසනයෙන් බැස්සෙ නැහැ. සභාවට කැළලක් ඇති වූ බවට අපි ඒ අවස්ථාවේදීම කිව්වා. අක්‍රමවත් සිදුවීම් සභාව තුළ සිදුවෙලා තියෙනවා.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මා මෙම සභාවේ සභාපති තුමියයි. වෙලාවෙන් වෙලාවට වචන වෙනස් කරලා කතා කිරීමේ අවශ්‍යතාවයක් මට නැහැ. දෙදෙනා අතර තර්කයක් ඇතිවෙලා අසභ්‍ය වචන භාවිතා කළ නිසා, මට ඉදිරියටත් සභාව පවත්වාගෙන යාමට නොහැකි තත්වයක් ඇතිවුණා. ඒ නිසා තමයි සභාව මා එතැනින් අවසන් කරන බවට පැවසුවේ.

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
ඔබතුමිය පවසන දේවල් මෙහි සිටින සියලුම දෙනාට ප්‍රශ්නාර්ථයක් තමයි. අපි සුපුරුදු පරිදි සභාව අවසන් කරන්නේ කොහොමද? මේ වතාවේ අපි අවසන් කළේ කොහොමද කියලා කවුරුත් දන්නවා. එදින සභාවේ ගරු සභාපති ඔබතුමිය ඉවසීමෙන් කටයුතු කරලා සභාව නිශ්ශබ්ද තාවයකට ගෙනඒමේ දැඩි අවශ්‍යතාවයක් උදාවෙලා තිබුණා. ඒ ස්ථානයේ එසේ සිදු වුණේ නෑ. සභාපති ආසනයේ සිටින අවස්ථාවේදී පක්ෂපාතිව හෝ පාටපාතීව කටයුතු නොකළ යුතුයි. ඔබතුමිය සියලු දෙනාට පොදුවේ කටයුතු කරමින් එදින සභාව අවසන් කරල තියෙන්න ඕන.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මේ වනතුරු මම එහෙම තමයි ඉන්නේ. මම එදා අනේක වාරයක් ඉල්ලා සිටියා. ඒ තරම් අසභ්‍ය වචන පාවිච්චි කරලා තිබුණා.

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
හොඳයි ගරු සභාපතිතුමියනි, එදින ඉන් පසුව කිසිම සිදුවීමක් සිදු වුණේ නැද්ද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාව අවසන් වීමෙන් පසු සිදුවෙන දේවල් පිළිබඳව මට වග කියන්න බැහැ.

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
ඒ අවස්ථාවේ සභාව අවසන් කරලා තිබුණේ නැහැ.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
අවශ්‍ය නම් පටිගත කිරීම අහල බලන්න.

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
පටිගත කිරීම ඕන විදියකට කරන්න පුළුවන්. නමුත් ඒ සිදුවීම අවස්ථාවේ අපි හිටියේ නැද්ද? ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමා, ගරු උප සභාපතිතුමාට පහර දෙන අවස්ථාවේ අපි සභාවේ හිටියේ නැද්ද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාව අවසන් කරලා තමයි මම ගිහිල්ලා එයත් එක්ක කතා කරගෙන සිටියේ.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාව අවසන්වීමෙන් පසුව එම සිදුවීම සිදු වෙලා තිබුණත් විශේෂ දැනුම් දීමක් වශයෙන් එම සිදුවීම වාර්තාවට ඇතුළත් විය යුතුයි. සභාවේ උද්ගත වූ සිදුවීමක් නේද? වෙන කොහෙවත් නෙවෙයි නේ? එවැනි සිදුවීමක් ඇයි වාර්තාවට ඇතුළත් කරන්න බැහැ කියන්නේ? එසේ නම් ඔබ තුමිය පක්ෂපාතීව කටයුතු කරලා තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
සභාව අවසන් කිරීමෙන් පසුව සිදුවන දේවල් වාර්තාවට ඇතුළත් කරන්න බැහැ. මම කිසිම අවස්ථාවක පක්ෂපාතීව කටයුතු කරලා නැහැ.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේකෙන් තේරෙනවා ඔබතුමිය එදා කටයුතු කළේ පක්ෂපාතීව කියලා. එනිසා කිසිම අවස්ථාවක මෙම වාර්තාව පිළිගන්න බැහැ.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
මේ ගරු සභාවෙන් මම ඉල්ලා සිටිනවා එදා මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් විශාල ලෙස කරුණු මන් ඉදිරිපත් කර සිටියා.මස්කෙළිය ප්‍රධාන බෝක්කුවේ ඇතැම් පිරිසක් සහයෝගය දක්වලා බෝක්කුවේ කණු හිටවලා ගොඩනැගිල්ලක් ඉදිකරලා තියෙනවා. මේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මස්කෙළිය පොලීසියේ පැමිණිලි කරලා තියෙනවා. මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් ලියුම් යවලා තියෙනවා කඩලා ඉවත් කරන්න කියලා. අදාල පාර්ශවයේ එක්කෙනෙක් කට උත්තරයක් දෙනවා මන් කඩලා ඉවත් කරන්නම් කියලා. ඇතැම් පාර්ශවයක් සහයෝගය දක්වලා ප්‍රාදේශීය සභා පනතට, නීතියට හෝ බය නැතිව ඒ ගොල්ලන් මේ කටයුතු සිදු කරන නිසා ඒ වෙලාවෙදි මන් කරුණු ප්‍රකාශ කර සිටියා ඇයි මේ ගොඩනැගිල්ල අපට ඉවත් කරන්න බැරිද? ඒකට හේතුව මොක්කද? කියලා මන් අහන කොටයි මේ ප්‍රශ්නය මතුවුණේ. එවැනි අවස්ථාවක් තුල මෙම මහා සභා වාර්තාව තුල සදහන් වෙලා තියෙනවා මම කතාව පවත්වන්න යනකොට ඇතැම් ඒ කියන්නේ මෙතන දාලා තියෙනවා නම සදහන් කරන්න වෙනවා මට ආනන්දරාජ් කියන මන්ත්‍රී තුමා මගේ කතාවට බාධා එල්ල කළා. එයා මට වීදුරු ප්‍රහාරයක් එල්ල කළා කියලා සදහන් වෙලා තියෙනවා. එතුමා මට සපත්තුවෙන් පහර දෙන්න ආවා.ඒක මෙහි සදහන් වෙලා නෑ.

ඊට අමතරව ගරු සභාපති තුමිය මෙතන ගරු මන්ත්‍රී තුමාගේ කතාවට උත්තර දුන්නා. මේ සභා වාර්තාවට ඕක දාන්න බෑ. සභාව ඉවර වෙච්ච ගමන් තමයි මෙම ප්‍රශ්නය මතුවුණේ කියලා. මේක මතුවුණේ සභාව තුල. සභාපතිතුමිය වාඩිවෙලා හිටියේ පුටුවේ. මෙම පත්තරය වගේම ලංකාදීප වැනි පත්තර ගණනාවක් මෙතන තියෙනවා. අදාල පාර්ශවය ඒ කියන්නේ පොදුජන පෙරමුණ නියෝජනය කරන දිසානායක මන්ත්‍රී වරයා මට පහර දීලා තියෙනවා. පත්තර කිහිපයකට එතුමා සදහන් කරලා තියෙනවා " මගේ අනවසර ඉදිකිරීම සිදු කරන අවස්ථාවේදී ......." මම මෙය ගරු ලේකම් තුමාට කියවන්න දෙන්නම්. ගරු ලේකම් තුමා පොඩ්ඩක් මේක පැහැදිලිව කියවන්න. මේ පත්තරේ අදාල පාර්ශවයේ කට උත්තරයයි පොලිසියේ තියෙන කට උත්තරයයි මේ සභා වාර්තාවේ තියෙන කට උත්තරයයි තුනම වෙනස්. පොලිසියේ කට උත්තරයයි මේ පත්තරේ තියෙන කට උත්තරෙයි මාධ්‍යට දුන්න කට උත්තරෙයි තුනම එකයි. මේ සභා වාර්තාවේ තියෙන එක තමයි වෙනස් වුණේ. වෙනස් වුණේ මොකක්ද? මෙතන මොකක්හරි දෙයක් හංගනවද කියලයි අපට සැකයක් මතු වුණේ. ඒ නිසා ගරු සභාපති තුමියනි, ඔබ තුමිය සියළු දෙනාට පොදුවේ කටයුතු කරන බල රහිත නීතිපති කෙනෙක්. ඔබතුමිය ස්වාධීනව කටයුතු කරානම් මෙවැනි ගැටුමක් මතුවෙන්නේ නෑ. මගේ ඉල්ලීම මේකයි. එදා සභවේ සිදුවුණ සිදුවීම මම කණගාටුදායක සිදුවීමක් හැටියටයි හෙලා දකින්නේ. මේ සිදුවිම මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පමණක් නොවෙයි වෙනත් කිසිදු සභාවක් තුල සිදු නොවෙන්න කටයුතු කරන්න ඕන කියලයි මගේ ඉල්ලීම. එනිසා මෙවැනි ප්‍රශ්නයකට සහයෝගය දක්වන්න සියලු දෙනා මෙවැනි කලු පටිය ඇදගෙන ප්‍රාදේශීය සභාව තුල තිබෙන නීතිය, එයට තිබෙන ගෞරවය ආරක්ෂා කරන්න ඉල්ලන්නයි, මෙවැනි සිදුවීමක් මස්කෙළිය ප්‍රාදේශීය සභාව තුල පමණක් නොවෙයි කිසිදු ප්‍රාදේශීය සභාවක් තුල සිදු නොකරන ලෙස ඉල්ලන්නයි අද අපි මේ ගරු සභාවට කලු පටි පැලදගෙන පැමිණ සිටින්නේ කියලා මම මේ වෙලාවෙදි

කරුණු දක්වමින් ගරු ලේකම්තුමාට මම පත්තරේ භාර දෙනවා මේකෙන් මේ කොටස පොඩ්ඩක් කියවන්න කියලා. ගරු ලේකම්තුමා ඔබතුමා පරිවර්ථනය කරන්න. නිලධාරියෙක් හැටියට ඔබතුමා පත්වෙලා ඉන්නවනේ. මෙතන පත්තර ගණනාවක් තියෙනවා සභාපති තුමියට දෙන්න. එදා සිදුවුණ සිද්ධිය මෙම පත්තර වල තියෙනවා. මෙවැනි සිදුවීමක් වෙන කිසිදු සභාවක සිදු නොවෙන්න කටයුතු කරන්න කියලා මන් ඉල්ලා සිටින අතර ගරු සභාපතිතුමියට මන් කිසිම වෙලාවක දොස් කියන්නේ නැහැ. සභාපතිතුමිය තමන්ගේ නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය නිසියාකාරයෙන් කටයුතු කරන්න කියලා මන් ඉල්ලා සිටින අතර අද මේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කරලා තියෙන දෙසැම්බර් මාසයේ 13 වෙනි දින ඉදිරිපත් කරන මහා සභා වාර්තාව සම්පූර්ණයෙන්ම සභාවෙන් අපි සියලු දෙනාම ප්‍රතික්ෂේප කරන බව ඉල්ලා සිටිමින් මන් නිහඩ වෙනවා.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>

ගරු උප සභාපතිතුමාගේ ප්‍රකාශයට අනුව අනුමැතියක් නොලද ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මෙහි සිටින මන්ත්‍රීවරයෙක් සම්බන්ධ වෙලා තියෙනවා. මේ පිළිබඳ වූ ලිපියක් ගරු ආණ්ඩුකාරතුමාට සහ කොමසාරිස්තුමාට ඉදිරිපත් කිරීමට මම සූදානම්. එකී ගරු මන්ත්‍රීවරයා තමයි ඒ අයට ගොඩනැගිල්ල ඉදිකරන ලෙසට කියලා තියෙන්නේ. නැවතත් එම මන්ත්‍රීවරයා ගිහිල්ලා ඒක කඩන්න කියනවා. මේ වගේ අවස්ථාවකදී අපි ගිහිල්ලා ගොඩනැගිල්ල ඉදි කරන්න එපා කියලා නවත්තනවා. පොලිසියට පැමිණිලි කරනවා. ඊට පස්සේ ඉදිකරන්න කියනවා. මස්කෙළියේ සිදුවෙන්නේ මේ විදියටයි. මම සියලුම මන්ත්‍රීවරුන්ට චෝදනා කරන්නේ නැහැ. අදාල මන්ත්‍රීවරුන් මේ වගේ වැඩ නවත්වා ගන්න. සභා වාර්තාව සම්බන්ධයෙන් මම පක්ෂපාතීව කටයුතු කරලා නැහැ. මගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලන දේවල් වලට වඩා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලන දේවල් තමයි මම ඉටුකරල දීල තියෙන්නේ. සභාව ආරම්භ කර මෙම අවුරුදු හතරක කාලය තුළ මාගේ පක්ෂයේ සිටින කිසිම මන්ත්‍රීවරයෙකුට මම කිසිදු සහනයක් ලබා දීලා නෑ. මෙය ඕනෑම ස්ථානයක මට සහතික කරන්න පුළුවන්.

<u>ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>

2021.12.13 දිනැති සභා වාර්තාවේ සඳහන් අඩුපාඩු පිළිබඳව අපි කතා කරගෙන සිටින මේ අවස්ථාවේ එදින සභා රැස්වීමේ දී සිදු වූ ප්‍රශ්නය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකොට විනයාණුකූල කටයුතු සිදුකළ යුතු නිසා අද දින මෙම සභාවට කලු පටියක් පැළඳගෙන අපගේ විරෝධතාවය ඉදිරිපත් කරලා තියෙනවා. අදාල සභා වාර්තාවේ අවසන් පිටුවේ ස්ථාන දෙකක උප සභාපතිතුමාගේ කතාව සඳහන් වෙනවා. 16 වන පිටුවේ මාගේ කතාව සඳහන් වෙනවා. ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව සම්බන්ධ කරගනිමින් මම අදහස් ප්‍රකාශ කරලා තිබුණා.

අවසන් පිටු කිහිපය ඉතාමත් අවධානයෙන් බැලුවොත් එදින ප්‍රශ්නය ඇයි උග්‍ර වුණේ කියන ප්‍රශ්නයට සාක්ෂි කිහිපයක් ලැබෙනවා. පසුගිය සභා රැස්වීම් වලදී අපි නීති විරෝධී ගොඩනැගිලි පිළිබඳව ගොඩක් කතා කරලා තියෙනවා. මේ නීති විරෝධී ගොඩනැගිලි පිළිබඳව කමිටුවකුත් පත් කරලා තිබුණා. ඉන් කිසි පලක් වුණේ නැහැ. මෙම ගොඩනැගිලි පිළිබඳව ගරු උප සභාපති තුමා කතා කරන අවස්ථාවේදී ගරු මන්ත්‍රී ආනන්දරාජ් මැතිතුමා සමඟ තර්කය ආරම්භයේදීම ඔබතුමිය ගරු මන්ත්‍රී ආනන්දරාජ් මැතිතුමාගේ පැත්ත ගත්තා. ඊට අතරමැදි කාලයේදී සිදුවූ දේවල් වාර්තාවට ඇතුළත් කර තිබුණා නම් එම වාර්තාව සම්පූර්ණ වාර්තාවක් බවට අපිට බලන්න පුළුවන්. ලේකම්තුමා වාර්තාවට වගකිවයුතු පරිපාලන නිලධාරි වරයෙක්.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>

සභාව මෙතනින් අවසන් කරන බවට ප්‍රකාශ කරලයි මම ආසනයෙන් නැගිටලා ගියේ. මම නිශ්ශබ්ද වෙන්න කියලා ලොකු හඬකින් කීවත් කවුරුවත් ඒක පිළිගත්තෙ නැහැ. ඉන්පසුව තමයි මම සභාව අවසන් කළේ. පටිගත කිරීම් තියෙනවා අවශ්‍යනම් ඒකත් දාලා පෙන්වන්නම්.

<u>ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>

පටිගත කිරීම දාලා පෙන්වන්න. අපිට ගැටළුවක් නෑ. ඒකට සවන් දෙන්න ඕන. අපිත් සභාවේ තමයි හිටියෙ. ඒවා ඇස් දෙකට දැක්කා. සභාපතිතුමියත් සමහර වචන හරඹයක් කරල තිබුණා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නිශ්ශබ්ද වන්න කියලයි මම කිව්වේ.

**<u>ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
කෑගහන්න එපා කියලයි ඔබතුමිය කිව්වේ. ඔබතුමිය එසේ කිව්වායින් පස්සෙ තමයි මම කිව්වේ 'මෙහෙ බුරන්න බල්ලෝ නැහැ" කියලා. මේ සිදුවීම් ටිකත් වාර්තාවට ඇතුළත් වෙන්න ඕන. මේවා වාර්තාවට ඇතුළත් නොකිරීම සම්බන්ධව ලේකම්තුමා අපට වගකියන්න ඕන. මෙහිදි ඔබ පක්ෂපාතීව කටයුතු කරලා තියෙන නිසා තමයි මම මේක කියන්නේ. ප්‍රායෝගිකව අපි දැකලා තියෙනවා. සභාපතිතුමිය පක්ෂපාතීව නැහැ, දේශපාලනයට පක්ෂව නැහැ, කියලා සභාපතිතුමිය සහ මන්ත්‍රීවරුන් කියන එක අපි අහලා තියෙනවා. ඒ අයගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව යන්න සිදුවෙන තත්ත්වයක් උදාවෙනවා. ඒක පිටුපාන්න බැහැ. ඒ ඒ පක්ෂ වලට අනුව සමහර දේවල් සිදු වෙනවා. ඔබතුමිය පැවසූ වචන ටික වාර්තාවට ඇතුළත් නොවුණේ ඇයි කියන එකට පරිපාලනය භාරව සිටින නිලධාරී වශයෙන් ලේකම්තුමා අපට වගකියන්න ඕන. සත්‍ය වසන් කරන්න බැහැ කියන එක වාර්තාව සකස් කරන නිලධාරීන්ටත් මම කියනවා. සමහරවිට වාර්තාව ලස්සනට තියෙන්න ඕන කියන නිසා වාර්තාව මෙහෙම හදන්න ඇති. නමුත් සභාවේ සභාපතිනිය මෙවැනි වචන භාවිතා කිරීම සුදුසුද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මම එහෙම කිව්වේ නැහැ.

**<u>ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අවශ්‍ය නම් මේකටත් පටිගත කිරීම අහලා බලන්න. සමහර විට ඒ කොටස පටිගත කිරීමෙන් මකලා තියෙන්න පුළුවන්. සභාව ආරම්භ කිරීමට පෙර සැලසුම් සහගතව මෙම සභාවේ ඔබතුමිය විසින් මාගේ නම පිටතින් සිදුවූ සිදුවීම් සම්බන්ධ කරගෙන ගොතලා තියෙනවා. ඒවා සම්බන්ධයෙන් මම මේදක්වා මතු කළේ නැහැ. නමුත් ඒවා දැනට සමාජය පදනම් කරගෙන මතු කිරීමේ අවශ්‍යතාවයක් උදාවෙලා තියෙනවා. අපට ලැබිය යුතු අපේ අයිතිවාසිකම් උදුරාගෙන තියෙනවා. ඒ නිසා තමයි එදත් මම නැගිටලා කතා කළේ. නැතුව කිසිම අවස්ථාවක සභාපතිධූරයට තෝරා ගන්නා ලද ඔබතුමියට හෝ උප සභාපතිතුමාට හෝ ඔබගේ පාක්ෂිකයින්ට හෝ කිසිම අවස්ථාවක කිසි තැනක අපහසුතාවයකට පත් කරලා නැහැ.
අපි කෙළින්ම ගැටළුවකට පත්කර ගත්තේ කොමසාරිස්තුමා සමඟ සහ අදාල පොලිසියත් එක්කයි. නමුත් කුමන හේතුවක් නිසාද මගෙන් පළිගත්තේ කියලා මම දන්නවා. මෙම සභාවේ මමත් වැඩි ඡන්දයෙන් තේරී පත්වූ මන්ත්‍රීවරයෙක්. ගරු උප සභාපතිතුමාට පහරදීම සම්බන්ධ කරුණු වාර්තාවට පමණයි ඇතුළත් වෙලා නැත්තේ. මේ ආසන සංඛ්‍යාව මේ පිළිවෙලට තියෙන අවස්ථාවේ දී තමයි එම පහරදීම සිදුවුණේ. ගරු උප සභාපති තුමා සහ ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමා අතර කිසිදු මතභේදයක් ඇතිවෙලා තිබුණේ නැහැ. පහරදීම් සිදුවුණු නිසා තමයි ගරු මන්ත්‍රීවරුන් වශයෙන් අපි පස්සෙන් ඉන්නේ. මීට පෙර බොහෝ තැන්වල මේ වගේ තර්කවීම් සිදුවෙලා තියෙනවා. නමුත් අපි ඒවා සාධාරණීකරණය කරන්න ගිහිල්ලා නැහැ. මෙම පාලනය පිහිටුවාගන්නත්, සභාවේ කුමන කරුණක් පිළිබඳව ගරු සභාපතිතුමිය කතා කළත් ඒ සියලුම දේවල්වලට ගරු උප සභාපතිතුමා පක්ෂව කටයුතු කරලා තියෙනවා. මෙවැනි දේවල් මින්පසුව කුමන හෝ අවස්ථාවක සිදුවෙන්න ඉඩ තියෙනවා. සත්‍ය වසන් කරන්න හොඳ නෑ. එදා සභාව අවසන් කරලා තිබුණා නම් ඊළඟ සභාව සඳහා දිනයක් ප්‍රකාශ කළේ නැහැනේ. ඊළඟ සභාව සඳහා දිනයක් ප්‍රකාශ කළානම් ඒ සඳහා වූ පටිගත කිරීම් තියෙනවාද?.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අවුරුද්ද ආරම්භ වන අවස්ථාවේදීම එළඹෙන මාසවල දින දැනුම් දීලා තියෙනවා.

**<u>ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සෑම පැත්තකින්ම යුක්තිය ඉටු කිරීමේ වගකීම ඔබතුමියට සහ ලේකම්තුමාට තියෙනවා. ඒ වගේ මෙහිදී යුක්තිය ඉටු වුණාද නැද්ද කියලා අපි දන්නේ නැහැ. මෙම වාර්තාව සම්පූර්ණ නැහැ. සභවන ලද දේවල්

පිළිබඳව මම සිහිපත් කරලා තියෙනවා. අපි වගේම රජයේ රාජකාරි භාර ගන්නා අවස්ථාවේදී දිවුරුම් දෙන්න ඇති. එදින ගරු සභාපතිතුමියට අදාල තිදෙනා සභාවෙන් නෙරපන්න තිබුණා.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**</u>
මම එදා ඒක කිව්වා.

<u>**ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
නැතිනම් පොලිස් නිලධාරීන් හෝ අපේ නිලධාරීන් යොදාගෙන ඒ අය එළියට යවන්න තිබුණා. ඒවා කරන්න පුළුවන්. ඒ නිසා මෙම කාරණාව පිළිබඳව ගරු සභාපතිතුමිය සහ ලේකම්තුමා විධිමත් විමර්ශනයක් සිදුකළ යුතුයි. පෞද්ගලික ගැටළු මෙම සභාවට රැගෙන එන්න එපා. පළාත් පාලන සහකාර කොමසාරිස් තුමා සහ පළාත් පාලන කොමසාරිස් තුමා වුවද පක්ෂපාතීව කටයුතු කරන බවටයි පෙනීයන්නේ. ගරු ආණ්ඩුකාරතුමාත් මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. අනෙකුත් සියලුම ස්ථානවල සියලු දේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන පළාත් පාලන දෙපාර්තමේන්තුව මෙහි පමණක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නෙ නැති වීමට හේතුව කුමක්ද? මේ කරුණ පිළිබඳව එම නිලධාරීන් හෝ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා හෝ පරීක්ෂක නිලධාරී හෝ කොමසාරිස්තුමා හෝ මේ සිද්ධියට සම්බන්ධ වෙලා තියෙනවද කියන එක තමයි ප්‍රශ්නේ. කොමසාරිස්තුමා සහ සහකාර කොමසාරිස් තුමා අවංකව කටයුතු කරනවානම් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ වාර්තාව අධ්‍යයනය කරමින් එහි පිටුපස ඇති ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳ අවධානය යොමුකර ගැටළු මතුවීමට තුඩුදුන් පසුබිම් මොනවාද යන්න සොයා නොබලා, සඟවා එවන එකේ ප්‍රතිඵලයක් වශයෙන් අද මේ තත්ත්වය උදාවෙලා තියෙනවා. මින් ඉදිරියට මෙවැනි තත්වයක් ඇති නොවීමට කොමසාරිස්තුමා සහ සහකාර කොමසාරිස්තුමා අවධානය යොමුකර වගබලා ගත යුතුයි.

එසේ නැතිනම් මෙම රටේ ජනාධිපතිතුමාට සහ පළාත් පාලන අමාත්‍ය තුමාට ද දැනගැනීම පිණිස, ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ ඉදිරිපිට වාඩිවෙලා, සියලුම වාර්තා පෙන්වලා, මේ තරම් ප්‍රශ්න සාකච්ඡා කරලා තියෙනවා, මේ සඳහා වූ විධිමත් තීරණ ලබාගෙන නැතිව ගරු ආණ්ඩුකාරතුමා මේවට අනුබල දෙනවා කියලා පැවසීමට සිදුවෙන බව ප්‍රකාශ කරමින්, මෙම සභාවේ සාකච්ඡා කළ බොහෝ දේවල් වාර්තාවෙන් සඟවලා තියෙනවා. මේ පිළිබඳව ලේකම්තුමා වගකිව යුතුයි. සභාවේ සාරධර්ම වලට එහායින් ගොස් අපි ලේකම්තුමාට සමහර අවස්ථාවන් ලබාදීලා තියෙනවා. සභාපති තුමිය පිළිතුරු දියයුතු සමහර අවස්ථාවලදී ලේකම්තුමා එම වගකීම භාරගෙන තියෙනවා. මේ වගේ සියලු වගකීම් භාරගන්න ඔබතුමා, ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ට සිදුවූ අපහසුතාවය වසන් කිරීම පිළිබඳව අපටත් අපහසුතාවයක් තියෙනවා. යෝජනා පිළිබඳව හෝ වෙනත් කරුණු පිළිබඳව ඉදිරිපත් කරන ප්‍රශ්න වලට ගරු සභාපතිතුමිය සෘජුවම පිළිතුරු දෙනවා නම් වඩාත් හොඳයි.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**</u>
මම පිළිතුරු දීලා තියෙනවා නේද? පරිපාලනය පිළිබඳව විමසන අවස්ථාවේදී ඒ කරුණු සඳහා ලේකම්තුමා පිළිතුරු ලබාදීලා තියෙනවා.

<u>**ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
සභාවේ ගන්නා තීරණ පිළිබඳව ඊට අදාළ නීතිමය කරුණු පදනම් කරගෙන ලේකම්තුමා ඒවා පරාජය කරලා තියෙනවා. නීති පොතේ කරුණු තියෙනවා, බලය කියනඑක ලබාගත්තාම ප්‍රදේශයේ යහපත උදෙසා කටයුතු කළයුතු අවස්ථා තියෙනවා. ඔබතුමිය ඒවා ඉටු කිරීමට අපොහොසත් වෙලා තියෙනවා.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**</u>
නීතියට පිටුපාල කටයුතු කරනවා නම් මෙම සභාවේ තවත් ප්‍රශ්න වැඩිවෙනවා. සභාපතිතුමිය වශයෙන් කළ යුත්තේ කුමක්ද කියන එක මම වටහාගෙන ක්‍රමවත්ව සිදුකරගෙන තියෙනවා.

<u>**ගරු. මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>

මෙම වාර්තාව පිළිබඳව යෝජනා ස්ථිර කර ගැනීමට පෙර අපි අපගේ අත් ඔසවා මෙම වාර්තාව සම්පූර්ණයෙන් විකෘති කර ඇති බවට ප්‍රකාශ කර මෙම වාර්තාවට විරුද්ධව අපගේ අත් ඔසවා අපගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිමු.

තවද මෙම කාරණාව පිළිබඳව සම්පූර්ණ විමර්ශනයක් සිදුකර පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන සහකාර කොමසාරිස් ද ගරු ආණ්ඩුකාරතුමාට ද සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර, එහි පිටපත් අප මන්ත්‍රීවරුන් හත් දෙනාට ම ලබාදෙන ලෙසට ද ඉල්ලා සිටිමි.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය සභාවේ සිදු වූ සිදුවීම් සම්බන්ධව ලිපි යොමු කළ බවට ප්‍රකාශ වුණා. එම ලිපියෙත් සභා වාර්තාවේ සඳහන් පරිදි එක් කොටසකට පක්ෂපාතීව ද සඳහන් කරලා තියෙන්නේ?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
එදා සිදු වූ සියලුම දේවල් එම ලිපියේ සඳහන් වෙලා තියෙනවා.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
ගරු මන්ත්‍රී සුරේෂ් කුමාර් සඳහන් කළ පරිදි ඒ අයගේ පැත්තෙන් ගරු සභාපතිතුමියට විරුද්ධව විවිධ විරෝධතා සඳහන් වෙලා තියෙනවා. ඒ අනුව ඒ සියලු දේවල් වලට හඬ නැගුවේ මමයි. කිසිම අවස්ථාවක ගරු සභාපතිතුමියව මම මගහැරලා නෑ. මේ කාරණාවේදී ඔබතුමිය පක්ෂපාතීව කටයුතු කරන්න බෑ. එහෙම බලනව නම් ඔබතුමිය මට පක්ෂපාතී විය යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මම පක්ෂපාතීව කටයුතු කළේ නැහැ. සභාවේ සිදු වුණ දේවල් පිළිබඳව පමණයි ලිපියේ සඳහන් කරලා යැව්වේ. සාකච්ඡා කළ කරුණු පමණයි වාර්තාවෙත් අඩංගු වෙන්නේ. කවුරුත් කතා කරපු දේවල් වාර්තාවට අඩංගු නොකිරීමට මම කටයුතු කරල නෑ. පසුගිය සභාවේ දී ගරු උප සභාපති තුමා සහ ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් යන දෙදෙනාටම කියලා බැලුවා. මම මේසයටත් තට්ටු කළා. කවුරුවත් සවන් දුන්නේ නැහැ. එනිසා මම සභාව අවසන් කරලා ගියා.

**ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
උදා වූ මෙම වසර සියලු දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන අතර වාර්තාව සම්බන්ධයෙන් ගරු උප සභාපති තුමා සහ ගරු මන්ත්‍රීවරුන් දකින අඩුපාඩු සඳහන් කළා. ඇත්තටම වාර්තාවේ යම් යම් අඩුපාඩු කිහිපයක් තියෙනවා. මෙම සභාවේ ආණ්ඩු පක්ෂයේ විපක්ෂය කියන භේදයක් නැතිව ඔබතුමිය සභාපති වෙලා ඉන්නේ සභාවටයි. සභාව පවත්වාගෙන යන අවස්ථාවේ දී උප සභාපතිතුමා කිව්වා 'ඔබ රුපියල් 30000.00 අල්ලසක් ලබා ගත්තා නේද?" කියලා. ඒ අවස්ථාවේදී මන්ත්‍රී ආනන්දරාජ් මැතිතුමාත් එම ප්‍රකාශයම සිදුකළා. ඒ සිදුවීම සභාව අවනස් කිරිමට පෙර සිදු වූ දෙයක්. ඒ සිදුවීම ඇයි වාර්තාවට ඇතුළත් කර ගත්තේ? අනවසර ඉදිකිරීම් පිළිබඳ ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව බලාත්මක කරමින් ගරු උප සභාපතිතුමා කතාව සිදු කරන අවස්ථාවේදී තමා අල්ලස් ලබාගත් බවට පැවසුවේ. එසේ නම් රුපියල් 30000.00 ක් ලබාගත් එක ඇත්ත නේද කියලා සභාපතිතුමිය ඇහුවා. අපි මන්ත්‍රීවරුන් 16 දෙනාගෙන් යුත් සභාව එක්තරා අත්තිවාරමක්. ඊළඟ පරම්පරාවට අපි මේක ඉතා හොඳ සභාවක් ලෙසට භාරදිය යුතුයි. සභාව සඳහා හොඳගරුත්වයක් තියෙනවා. මෙවැනි සිදුවීම් අපේ ඊළඟ පැම්පරාවට වැරැදි ආදර්ශයක් බවට පත්වේවි. අසභ්‍ය වචන භාවිතා කිරිම, පහරදීම් වැනි දේවල් වැරැදි මගකට යොමු කරයි. මෙහි පක්ෂ, ජාති හා ආගම් වැනි කිසි භේදයක් නැහැ. සියළු දෙනාම එකයි. අවුරුදු 05 ක් තුල මස්කෙළිය ප්‍රදේශයේ ජනතාවට විශිෂ්ට සේවාවක් ලබාදිය යුතුයි. මින් ඉදිරියට මෙවැනි දේවල් සිදු නොවිය යුතුයි.කොට්ඨාශ 10 කින් මහජනතාවගේ ඡන්දයෙන් තේරිපත්වූ අපි මහජනතාවගේ ප්‍රශ්න පිළිබඳව හඬ නැගිය යුතුයි.ඒ හැර මෙවැනි දේවල් වලට යොමු නොවිය යුතුයි. විනයාණුකූල පරීකෂණ සිදුකළ හොත් පමණක් නැවතත් මෙවැනි දේවල් සිදුවීම වළක්වා ගත හැකියි. සභාවේ සිදුවන යහපත් දේවල් සඳහා අපි සහයෝගය ලබාදීලා තියෙනවා. වැරැදි දේවල් පිළිබඳව ප්‍රශ්න කරලා තියෙනවා. ගරු මන්ත්‍රීවරුන් තමයි ගොඩනැගිලි ඉදිකරන්න කියලත් කියන්නේ පසුව කඩල ඉවත් කරන්න කියලා කියන්නෙත් කියලා ඔබතුමිය පැවසුවා. ඒ මන්ත්‍රීවරුන් කවුද කියලා කියන්න ඕන.

හේතුව සියලුම මන්ත්‍රීවරුන්ට එම චෝදනාව පිළි අරගෙන ගෙන යන්න බැහැ. ජනතාවට අපි ගැන විශ්වාසය තියෙනවා. සමහර කරුණු ඇයි වාර්තාවෙන් ඉවත් කළේ. මේ වගේ සිදුවීම් කොහොමද ඉහළ තැන්වලට යන්නේ? සභාව තුළදීම වසන් කරනවා. විනයානුකූල පරීක්ෂණයක් සිදුකළ යුතුයි. එම වාර්තාව සංශෝධනය කර සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නීතිමය කටයුතු සිදුකරලා තියෙනවා. පොලිසිය මගින් අධිකරණ ක්‍රියාමාර්ග ගැන නඩුවක් පවත්වාගෙන යනවා. සභාවේ සිදුවූ දේවල් පිළිබඳව කොමසාරිස්තුමාට ලිපියක් යොමුකරලා තියෙනවා. කොමසාරිස් තුමා විසින් පරීක්ෂණයක් සඳහා දිනයක් ලබාදෙනු ඇති. නැවතත් මම කියන්නේ, වාර්තාවේ කිසිම දෙයක් සඟවලා නැහැ. සභා කාලය තුල සිදුවූ කරුණු වාර්තාවට ඇතුලත් කරලා තියෙනවා. සභාව අවසන්වූ පසු සිදුවූ දේවල් වාර්තාවට ඇතුලත් කරන්න බැහැ.

**<u>ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
ගරු සභාපතිතුමියනි, ගොඩනැගිලි ඉදිකරන්න කියන්නෙත් නැවත ඒවා කඩන්න කියන්නෙත් එක්තරා මන්ත්‍රීවරයෙකු බව ඔබතුමිය මීට පෙර පැවසුවා. ඒ මන්ත්‍රීතුමා කවුද කියලා නම සඳහන් කරන්න. එදින පහරදීම් සිදුවීමට හේතුවද මෙම ගොඩනැගිලි පිළිබඳ කාරණාව තමයි. මෙහි සිටින මන්ත්‍රීවරුන්ගෙන් බොහෝ දෙනෙක් වතු ආශ්‍රිත මන්ත්‍රීවරුන්. වතුකරයේ සංවර්ධන කටයුතු පිළිබඳව කතා නොකර පෞද්ගලික අයවලුන්ගේ ගොඩනැගිලි පිළිබඳව සියලු ම සභාවල කතා කරනවා. ඉදිරි කාලයේ දී මෙවැනි දේවල්වලින් ඉවත් වෙලා හොඳ දේවල් පිළිබඳව සාකච්ඡා කරමු.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඒ පිළිබඳව සම්පූර්ණ කරුණු කොමසාරිස්තුමාට යවන ලෙසට අදාළ මන්ත්‍රීවරයා ම ඉල්ලලා තියනවා. ඒ පිළිබඳ ලිපි 03ක් තියනවා. මේවා කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර නීතිමය පියවර ගන්නවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
පසුගිය 13 වනදා සිදු වූ සිදුවීමට මාව අත දික් කරමින් ඔහු අල්ලස් ලබා ගත්තා කියලා මම කිව්වයි කියලා ඔහුට කවුද කිව්වේ කියන එක මෙම සභාවට කියන්න ඕනේ. මෙම සභාවේ නමට අපකීර්තියක් සිදු කළ යුතුයි කියලා මම හිතුවේ නෑ. සියලු ම මන්ත්‍රීවරුන් එක හා සමානයි. මට සිදු කළ අයුක්තියට නීතිමය පියවර ගන්නා ලෙසට ගරු සභාපතිතුමියගෙන් ඉල්ලා සිටිමි.

මම විශේෂයෙන් කියන්න කැමති මෙතැනට ඇවිල්ලා ඉන්න මම විතරයි සාමාජිකයෙක් වෙන්නේ. මගේ පවුලේ අය ආයතනයට ගන්නෑ. ගරු උප සභාපති තුමා එදා මගේ නංගී ගැන කතා කළා. මම සපත්තුවෙන් ගැහුවා කියලා කිවුවනේ උප සභාපතිතුමා. මම ඒ කතාවට තමයි සපත්තුවෙන් ගැහුවේ. මගේ නංගී දැන් මැරිලා අවුරුදු 15 ක් වෙනවා. ඒවා කතා කරන්න හොඳ නැනෙ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමිය, ගරු උප සභාපතිතුමිය, ගරු මන්ත්‍රී වරුන්ගෙන් අවසරයි. මම මෙය සභාවක් හැටියට කටයුතු කරන ලෙසට කාරුණිකව ඉල්ලා සිටිනවා. ගරු සභාපති තුමිය මෙතැනට පෞද්ගලික ප්‍රශ්න අරගෙන එන්න හොඳ නෑ. ඔබ තුමියගේ කාර්ය භාරය මේ න්‍යාය පත්‍රයට සභාව අරගෙන යන එක. නැත්තම් අද දවසම මේක ඇඳගෙන යයි. ඒකයි මම කියන්නේ. මේක මහ සභා රැස්වීමක්. මහ සභා රැස්වීමක න්‍යාය පත්‍රයක් තියෙනවා. ඒ න්‍යාය පත්‍රයට යන්න. නිකන් අනම් මනන් මේ සභාවතුල කතා කරන්න එපා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
බලාත්මක කිරීමේ වැඩසටහන පිළිබඳව මම යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා. අර කඩේ පිළිබඳ යෝජනාවට කවුරු කවුරුද ඉල්ලුම් කරලා තිබුණේ කියලා මම අහලා තිබුණා. නමුත් මෙහි සඳහන් වෙන්නේ 'සභාවට කරුණු ඉදිරිපත් කරලා තියනවා" කියලා. නමුත් එහි කරුණු නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔබතුමා ඉල්ලූ පරිදි විස්තර ලේකම්තුමා විසින් සභාවේ කියවීමෙන් ඉදිරිපත් කළා. ඒ නිසා තමයි විස්තර ඉදිරිපත් කළ බවට වාර්තාවේ සඳහන් වෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම සභාවේ ගරුත්වය, ගරුත්වය කියලා කතා කරනවා. නමුත් මෙහි ඇති ගරුත්වයක් නැහැ. වෙනත් ස්ථානයක කුමන පදනමකින් කරුණු ඉදිරිපත් කරනවද යන පදනම මත කටයුතු කළ බව ඔබතුමිය පවසනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව්. ටෙන්ඩර් කොන්දේසි පදනම මත තමයි සිදු කළේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
වැඩිම මුදලක් ලබා දෙන අයට කඩ පිරි නමන බව කියලා තියනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
වැඩිම තැන්පත් මුදල ඉදිරිපත් කරන අයට ටෙන්ඩරය ලබා දෙන බව මම පසුගිය සභාවේ දී පැහැදිලි කළා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
නමුත් ඉල්ලුම් පත්‍රය වැඩි මුදලක් ලබා දෙන අයට පිරි නමනවා කියලයි තියෙන්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව්. වැඩි තැන්පතුවක් තියන අයට.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
එදින සභාවේ සඳහන් විස්තර වෙනත් වාර්තාවක වෙනත් කෙනෙකුගේ නමක් සඳහන් වෙනවා.
තිදෙනෙකුගේ නම් කියෙව්වා. මෙහි සඳහන් වන්නේ එක් අයෙකුගේ නමක් පමණයි. මේක අහන්නේ මමයි. දැනට සභාවේ වසර 04ක් ගත වෙලත් තවමත් පෙර පාසලට යනවා වගේ තමයි තියෙන්නේ. සෑම අවස්ථාවක ම වාර්තාව සභා සම්මත වෙන්නේ සංශෝධන සහිතවයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීවරුන් ලිඛිතව ලබාදෙන යෝජනාවලින් අකුරු වැරැදි ගොඩක් තියනවා. මන්ත්‍රීවරුන් 16 දෙනෙක් කතා කරන සියලු ම දේ සංක්ෂිප්ත කරලා ලියනකොට සුළු සුළු අඩුපාඩු ඇති වීමට ඉඩ තියන නිසා තමයි වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, ගරු සුබ්‍රමනියම් මන්ත්‍රීතුමා එදා ඒ ප්‍රශ්නය සම්බන්ධව මතුකරනකොට එක කඩයක් සම්බන්ධව තමයි නම් ලැයිස්තුව ඇහුවේ .නම් ලැයිස්තුව කවුද කියලා ඒ තුන්දෙනාගේ නම් සඳහන් කරන්න කියලා ඉල්ලුවේ. එතුමා අහන්නේ ඒ කිවුව නම් තුනම මෙහි සඳහන් විය යුතුයි. ඒක සඳහන් කරලා නැහැ. සභාවේ කතා කලාම සභාපතිතුමිය උත්තර ඇහුවහම කොහොමද ඒක එන්නැතිව තියෙන්නේ. මේක තරහව ඇති කරලා ප්‍රශ්නයක් ඇති කරන මට්ටමකට ගියොත් අපිත් ලෑස්ති. ඔබතුමිය නිසි පිළිවෙළකට මේකට උත්තර දෙන්න. එතුමා ඇහුවේ තුන් දෙනාගේ නම් මොනවද කියලා. නිශ්ශංක වංචලාද මොකක්ද නමකට අමතරව තව නම් දෙකක් කියන්න කීවා. එතකොට නම් තුනයි. ඒ නම් තුනම මෙතන සඳහන් වෙන්න ඕන. ඒක ඇයි නැත්තේ. ඒකෙ වගකීම කවුද භාර ගන්නේ. බෑ බෑ ඊළඟ සභාවට දානව කියන් නැතිව සභාපතිතුමියනි, මෙතැන වැරැද්දක් වෙලා තියෙනවා. ඒ වැරැද්ද භාර ගන්න එහෙනම්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
වාර්තාවේ කඩ පිළිබඳ තොරතුරු වසන් කරලා තියනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
වසන් කරලා නැහැ. අවශය නම් ඒවා සම්බන්ධ කරලා සංශෝධනය කර ගත හැකියි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
මම අහන්නේ තොරතුරු දැන ගැනීමේ පනතින් තමයි. කවුරු කවුරුන්ද කඩේට ඉල්ලුම් කරලා තිබුණේ. කඩේ ලබා දුන්නේ කාටද? ලිපි ලැබුණු දින පිළිබඳව තොරතුරු මට අවශ්‍යයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
තොරතුරු දැන ගැනීමේ පනත මගින් මම විස්තර ලබා දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කඩ පද්ධති ටික නිර්මාණය කළේ රිකාටන් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ දී. සභාව සඳහා වූ විදුලි බිල ගැන කිසිවෙක් ගෙවීම් සිදු කළේ නැහැ කියලා ඔබතුමිය පැවසුවා. එසේ නම් කඩ නිර්මාණය කිරීම සඳහා වූ විදුලි බිල ගෙව්වේ කොහොමද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඒ සම්බන්ධ විස්තර ලබන සභා වාරයේ දී ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම සභාවේ පාලනය ලබා ගැනීම සඳහා කටයුතු කළ අභාවප්‍රාප්ත ගරු අමාත්‍ය ආරුමුගන් තොන්ඩමන් මැතිතුමා සිටියා නම් අද සභාපතිතුමිය ඇතුලු වැරදි කරන අය කවුරුත් මේ සභාවේ ඉන්නේ නැහැ. මෙවැනි වැරදි කරන අය එතුමා තියාගන්නේ නැහැ. ලංකා කම්කරු කොංග්‍රස් පක්ෂයේ පසුගිය කාලවල මමත් ඉදලා තියනවා. එම උසස් පුද්ගලයා දැනට සිටියා නම් මෙවැනි වැරදි සිදු වන්නේ නැහැ. පසුගිය සභා රැස්වීමේ දී එම සිදු වීමෙන් පසුව තුවාල ලැබූ අය ග්‍රාමීය රෝහලටත්, තර්කයේ යෙදුණු අය සභාපතිතුමිය මගින් රෝහලටත් රැගෙන ගිහින් තියනවා. සභාව පැවැත්වෙන අවස්ථාවේ සභාපතිතුමිය ආසනයෙන් බැහැලා ආව එක හෙලා දැකිය යුතු කාර්යයක්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
සභාව අවසන් කරලයි මම බැස්සේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
අද දිනයේ දී වුවත් ආරක්ෂක සේවා සඳහා කවුරුත් මෙහෙ පත් කරලා තියනවද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මෙහෙ කවුරුත් ළදරුවන් නැහැ. සභාවේ අණ නොතකා කටයුතු කරන්න බැහැ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා මගින් මෙම වාර්තාවත් එදින සිදු වූ කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් ද සම්බන්ධ කරගෙන පරීක්ෂණයක් සිදුකළ යුතුයි. එවැනි දේවල් කාට වුණත් සිදු වෙන්න පුළුවන්. සභාව ආරම්භ කරලා වසර 04ක් අපි වැරදි කරලා තියනවා. ඉතිරිව ඇති වසරක කාලයවත් හරියට ප්‍රයෝජනයට ගත යුතුයි. අපේ විශ්වාසය බිඳ වැටිලයි තියෙන්නේ. සමහර අවස්ථාවල දී සභාපතිතුමිය රාජකාරිය ඉටු කිරීමට අපොහොසත් වෙලා තියනවා. මෙම කරුණු පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ සෘජු නිරීක්ෂණයට රැගෙන යා යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
ගරු මන්ත්‍රීතුමනි, මම මගේ රාජකාරිය නිවැරදිව ඉටු කරමින් සිටිනවා. රාජකාරියෙන් බැහැර වෙලා නැහැ. මෙහි සිටින සියලු දෙනා ජනතාවගේ ඡන්දයෙන් පත්වීම් ලබා ගත් අය. තම තමන්ව නිවැරදි කර ගත යුතුයි.

**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියනි, අපේ සාමාජිකයින් කවුරුවත් සභා වාර්තාව පිළිගන්නේ නැහැ. ඒ සඳහා අත ඔසවමින් අපගේ විරෝධතාවය පල කරනවා.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
සභා වාර්තාව පිළිබඳව විවිධ තර්ක විතර්ක සිදු වෙමින් පවතිනවා. පසුගිය සභාවට මම නොපැමිණිය ද මෙහි කියැවෙන කරුණු අනුව කුමක් ද සිදු වුණේ කියන එක පැහැදිලියි. ගරු මන්ත්‍රීතුමා පවසන විදියට සභාව දැන් ඉදිරියට යනවට වඩා පසුබට වෙමින් පවතිනවා. ඒ නිසා සභා වාර්තාව වැරදි ද නිවැරදි ද කියන එක තහවුරු කිරීමට ඡන්ද විමසීමක් සිදු කරන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
සභා වාර්තාව නිවැරදි බවට පිළිගත්ත අය අත් ඔසවන්න.

2021.12.13 දින සභා වාර්තාව අනුමත කළ ගරු මන්ත්‍රීවරුන්..

01. ගරු සභාපති ජී.සෙන්බගවල්ලි මැතිතුමිය
02. ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා
03. ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා
04. ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා
05. ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා
06. ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා
07. ගරු මන්ත්‍රිනී කේ.ජී.කේ.පෙරේරා මැතිතුමිය
08. ගරු මන්ත්‍රිනි කේ.එල්.ඒ. රංජනී මැතිතුමිය.
09. ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
මීට පෙර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා මෙම ස්ථානයට පැමිණ සභා රැස්වීම පවත්වන වෙලාවේ දී අත ඔසවලා ඡන්ද ලබාගත නොහැකි බව පවසලා තියනවා. එක එක්කෙනාගෙන් අහන්න ඕන.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
එසේ නම් නැවතත් එක එක්කෙනාගෙන් අහමු.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
නැවතත් අහන්න බෑ. ඡන්ද ලබාදීම සඳහා ක්‍රමවේදයක් තියනවා නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
ඒ අය පක්ෂව නේද ඡන්දය ප්‍රකාශ කළේ?

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
මෙම ඡන්දය අවශ්‍ය නැහැ.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**

මේ ඡන්දෙ ඕන්නැහැ. මේ සභාව තුල ප්‍රජාතන්ත්‍රවාදය නෑ. ප්‍රජාතන්ත්‍රවාදයට මුල්තැන දෙන්න. මේ ඡන්ද විමසීම සිදු කරනවානම් එක් එක් අයගේ නම් සඳහන් කරායින් පස්සේ තමයි ඡන්ද විමසිම සිදු කරන්නේ. කොහොමද පොදුවේ අත උස්සන්න කියන්නේ. කවුද මේකෙ වගකීම භාර ගන්නේ. මෙතැනත් ප්‍රජාතන්ත්‍රවාදය නැත්තම් සභා වාර්තාව තුල කොහොමද ප්‍රජාතන්ත්‍රවාදය තියේනනේ. එදා ප්‍රශ්නයත් මතු වෙලා තුවාල වෙලා මම රෝහල් ගත වුනෙත් මේ නිසයි. කරනවානම් හරි විදිහට කරන්න. දන්නේ නැත්තම් දන්න කෙනෙක්ගෙන් අහලා කරන්න කියලයි මම ඉල්ලා සිටින්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
සභා වාර්තාව සඳහා පක්ෂව ඡන්ද ලබාදෙන අය නැගිට තමන්ගේ සහය ලබා දෙන්න. එකින් එක්කෙනා එන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
පසුගිය සභා රැස්විමේදී අනවසර ගොඩනැගිලි පිළිබඳව කතා කළා. මෙම සභාවේ මම අවංක පුද්ගලයෙක්. තඹ සතයක්වත් මම අයුතු ලෙස භාවිතා කරලා නෑ. . තඹ සතයක්වත් අල්ලස් අරගෙන නෑ. මෙම කාර්යය සියලුම මන්ත්‍රීවරුන් අපහාසයට පත් කරනවා. එක මන්ත්‍රීවරයෙක් කිසිදු වැරැද්දක් නොකර දින දෙකක් සිර මැදිරියේ ඉඳලා තියෙනවා. අල්ලස් ලබාගත් අයගේ විස්තර ගරු ආණ්ඩුකාරවරයා වෙත යවනවා කියලා ගරු සභාපතිතුමිය පැවසුවා. ඊළඟ සභා වාරයේදී ඔවුන්ගේ නම් සභාවට ඉදිරිපත් කළ යුතුයි. දඬුවම් ලබාදිය යුතුයි. පසුගිය සභා වාරයේ වාර්තාව නිවරැදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රීනි කේ.ජී.කේ.පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු සභාපතිතුමියනි, ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී වරුන්ගෙන් අවසරයි. පසුගිය මාසයේ සිදුවුණ සිද්ධිය අපි ඇස් දෙකෙන් දැක්කා. ඒ ගැන හිතලා මේක වැරැදි වැරැදි කියලා කිවුවට ඒ සභාව ගෙනියන්න තරම් කාලයක් ඇති වුණේ නැහැ. මේ වෙලාවේ අපේ ගරු උප සභාපතිතුමයි, ගරු මන්ත්‍රීතුමත් අතරේ යම් භේදයක් ඇති වෙලා සභාව සභාපතිතුමිය විසින් නවත්වන්න සිදුධවුණා. ඒ නිසා ඒ සියලු විස්තර කෙටියෙන් හෝ මෙහි යොමු කරලා තියෙනවා. එයට අපි සහය දක්වලා සභා වාර්තාව නිවැරදි බවට අත ඔසවා සහය දක්වනවා.

2021.12.13 දිනැති සභා වාර්තාවට විරෝධය පලකළ පිරිස.

01. ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා
03. ගරු මන්ත්‍රී කේ.සුරේෂ් කුමාර් මැතිතුමා
04. ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා
05. ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා
06. ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා

**තීරණ අංක 01**
වැඩි ඡන්ද දෙකකින් 2021.12.13 දිනැති මහා සභා වාර්තාව සභා සම්මත කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මාගේ විශේෂ කතාවේදී 2022 වර්ෂය සඳහා කොට්ඨාශ මන්ත්‍රීවරුන්ට ගරු මුදල් අමාත්‍යතුමා මගින් රුපියල් ලක්ෂ 40 ක් වටිනා වැඩසටහන සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරන ලදි. මේ සඳහා ස්තුතිය පුදකරන අතර,එම වැඩසටහන සම්බන්ධ විස්තර ඇතුලත් ලිපි නැවතත් යොමුකරලා තියෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහන්කළ පරිදි නැවත්ත එය සංශෝධනයකර යොමුකළ යුතුයි. මෙම අවස්ථාවේදි සභාව වෙනුවෙන් සහ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමාට ස්තූතිය පුදකරමි. ඊළගට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන්න.

**ලිපි අංක 01 –**

යොමුව - ආදායම් පරීක්ෂක
විෂය - බ්‍රවුන්ලෝ වත්ත ආශ්‍රිතව වරිපණම් බදු අය කිරිම සම්බන්ධව පසුගිය සභාවේ ඉල්ලා සිටි විස්තර පිළිබඳ ලිපිය

<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
පසුගිය සභා වාරයේදී මම තමයි එම විස්තර ඉල්ලා සිටියේ. එසේනම් මීට පෙර අයකරගන්නා ලද මුදල නැවත්ත එම ජනතාවට ලබාදිය හැකිද කියන එක සොයා බලන්න. එසේ නොමැතිනම් නැවත්ත දිගටම එම ජනතාවගෙන් වරිපණම් බදු අයකිරිමට කටයුතු කරන්න.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
අඹගමුව ප්‍රාදේශීය සභාවට ලිපි යොමු කරලා අසා බලමු.

**ලිපි අංක 02 –**
යොමුව - ආදායම් පරීක්ෂක
විෂය - 2022 වර්ෂය සඳහා වරිපණම් බදු අය කිරීම ගැසට් කිරීම සම්බන්ධ ලිපිය

<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>
2022 වර්ෂය සඳහා වරිපණම් බදු අය කිරීම ගැසට් කිරීම සඳහා මාගේ පූර්ණ සහයෝගය ලබාදෙමි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
පසුගිය සභා වාරයේදීද මෙම කාරණාව ඉදිරිපත් කළ ද සභාවේ අනුමැතිය ලැබුණේ නැහැ. ගැසට් නිවේදනය නිකුත් තිරිමට අනුමැතිය අවශ්‍යයි.

<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>
බදු මුදල් අය කිරිමට අනුමැතිය ලබා දෙන්න පුළුවන්. නමුත් කාලයකට අනුව බදු මුදල් වැඩි කළ යුතුයි නේද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
බදු මුදල් වැඩි කිරිම සම්බන්ධව ඉල්ලා සිටියේ නැහැ. 2022 වර්ෂය සඳහා වූ බදු මුදල් අය කිරිමට සහ ගැසට් නිවේදන නිකුත් කිරිමටයි අනුමැතිය ඉල්ලන්නේ.

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>
බදු මුදල් අනිවාර්යෙන් අය කළ යුතුයි. අය කළොත් පමණයි සභාව පවත්වාගෙන යන්න පුළුවන්. ඊට විරුද්ධ වුනොත් සභාව පවත්වාගෙන යාමට සහයෝගය ලබා නොදෙනවා කියලයි අර්ථවත් වෙන්නේ. බදු අයකළ යුතුය කියන එක මගේ පෞද්ගලික මතය. එසේ වුනොත් තමයි කොට්ඨාශ මට්ටමේ සංවර්ධන සිදුකළ හැක්කේ. එනිසා මේ සඳහා මාගේ සහයෝගය ලබා දෙනවා.

<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
2022 වර්ෂය සඳහා බදු මුදල් අය කිරීමට මාගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>
ගරු සභාපතිතුමිය වෙත  ප්‍රශ්නයක් ඉදිරිපත් කරමි. සභාව ආරම්භ කළ කාලයේ සිට කුකුල් මස් කඩ මගින් ලැබුණු ආදායම කොපමණද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මේක ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරන්න. මම ඊළඟ සභා රැස්වීමේදි පිළිතුරු ලබා දෙන්නම්.

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>

ලාභයිද පාඩුයිද  කියලා කියන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අනිවාර්යෙන්ම පාඩු තමයි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මෙකට හේතුව කවුද? අපේ මන්ත්‍රීවරුම තමයි. මීට පෙර සභාවට පාඩුවක් කළා සේ දැනට බදු මුදල් අය කිරිම සම්බන්ධවත් සිදු කරන්න බලනවා. අනිවාර්යෙන්ම බදු මුදල් අයකළොත් පමණයි සභාව පවත්වාගෙන යන්න පුළුවන්.

**<u>ගරු මන්ත්‍රීනි  කේ.ජී.කේ.පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
සභාපතිතුමියනි, අළුතෙන් වරිපණම් ගන්න අවස්ථාව ලබා ගන්න බැරිද? කුඩා මස්කෙළියේ තියෙනවානේ සභාපතිතුමිය සැහෙන ප්‍රශනයක්. ගරාජ්, කඩ, ගෙවල් තියෙනවා. ඒකෙන් ලොකු ආදායමක් සභාවට ගන්න පුවවන් නිසයි මන් ඒ ගැන කතා කළේ. අළුතින් මොනවාහරි කරලා ඒක ක්‍රියාත්මක කරන්න

**<u>ගරු මන්ත්‍රීනි  කේ.එල්.ඒ.රංජනි මැතිතුමිය (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, මම කැමති වරිපණම් අය කරනවානම්. ඒකෙන් සභාවටත් ආදායමක් ලැබෙනවා. ඒකට මම කැමැත්ත පල කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජ.නි.පෙ)</u>**
බදු මුදල් අය කිරිම සඳහා මාගේ එකඟතාවය පළ කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී.ලං.පො.පෙ)</u>**
බදු මුදල් අය කිරිම සඳහා මාගේ එකඟතාවය පළ කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභා කටයුතු සිදු කරගෙන  යාම සඳහා මෙම කාරණාව අත්‍යවශ්‍ය බැවින් මේ සඳහා මාගේ සහයෝගය ප්‍රකාශ කරමි.

2022 වර්ෂය සඳහා වු බදු මුදල් අය කිරිම පිළිබඳව ගැසට් නිවේදනය පල කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම ඡන්ද  විමසීමකට යොමු කල අතර ඒ සඳහා පක්ෂව ඡන්ද 10ක් හා විපක්ෂව ඡන්ද 6ක් ලබා දෙන ලදී.

**<u>පක්ෂව</u>**

01. ගරු සභාපති ජී.සෙන්බගවල්ලී මැතිතුමිය
02. ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා
03. ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා
05. ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා
06. ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා
07. ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා
08. ගරු මන්ත්‍රීනී කේ.ජී.කේ.පෙරේරා මැතිතුමිය
09. ගරු මන්ත්‍රිනි කේ.එල්.ඒ. රංජනී මැතිතුමිය.
10. ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා

**විපක්ෂව**

01. ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා

03. ගරු මන්ත්‍රී කේ.සුරේෂ් කුමාර් මැතිතුමා
04. ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා
05. ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා

**තීරණ අංක 02**
**2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව මගින් බදු මුදල් අය කිරීම සම්බන්ධ ගැසට් නිවේදනය පල කිරීම වැඩි ඡන්ද 4න් සම්මත කරන ලදී.**

ලිපි අංක 03 –
යොමුව - පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය.
විෂය - මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ නිල ගොඩනැගිල්ල පිළිබඳ වූ ලිපිය.

ලිපි අංක 04 –
යොමුව - පළාත් පාලන සහකාර කොමසාරිස්
විෂය - 2021 ඔක්තෝම්බර් මහ සභා වාර්තාවේ නිරීක්ෂණ ලිපිය.

ලිපි අංක 06 –
යොමුව - දෙවන වීදියේ පදිංචි කරුවන්, මස්කෙළිය
විෂය - දෙවන විදීයේ කාණු පද්ධතිය අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීම

ලිපි අංක 07 –
යොමුව - පළාත් පාලන සහකාර කොමසාරිස්
විෂය - සභා රැස්වීම පැවැත්වීම සහ සභා රැස්වීම් සදහා වූ කාල සටහන ලබා ගැනීම පිළිබඳ වූ ලිපිය

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභා වාර්තාව සහ සභා කටයුතු පිළිබඳව කොමසාරිස්තුමා හොඳට නිරීක්ෂණය කරලා තිබෙනවා. නමුත් අප සභා වාර්තාව දින කීයකට පෙර ද ලැබෙන්නේ කියන එකත් සොයා බැලිය යුතුයි. සතියකට පෙර අපට ලැබිය යුතුයි. මේ වාරයේ ලැබුණේ දින තුනකට පෙරයි. ලියා පදිංචි තැපෑලෙන් යොමු කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
යෝජනා ලිඛිතව ලබා දෙන්නේනම් වාර්තාව ඉක්මණින් ලබා දිය හැකියි.

**2022 වර්ෂය සදහා වූ රැස්වීම් කාල සටහන**

| මහ සභාව පවත්වනු ලබන මාසය | මහ සභාව පවත්වනු ලබන දිනය |
|---|---|
| ජනවාරි | 2022.01.12 |
| පෙබරවාරි | 2022.02.11 |
| මාර්තු | 2022.03.14 |
| අප්‍රේල් | 2022.04.11 |
| මැයි | 2022.05.13 |
| ජූනි | 2022.06.13 |
| ජූලි | 2022.07.12 |
| අගෝස්තු | 2022.08.12 |
| සැප්තැම්බර් | 2022.09.12 |
| ඔක්තෝම්බර් | 2022.10.12 |
| නොවැම්බර් | 2022.11.14 |

| දෙසැම්බර් | 2022.12.12 |
|---|---|

ලිපි අංක 08 –
යොමුව - සහකාර කොමසාරිස් කාර්යාලය
විෂය - කොවිඩ් 19 වසංගතය තුරන් කිරීමේ කටයුතු සඳහා සභාව මඟින් ගෙවන ලද වියදම් පිළිබඳ ලිපිය

ලිපි අංක 09 –
යොමුව - පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත යොමු කරන ලද ලිපියේ පිටපත
විෂය - 2021.12.13 දිනැති මහා සභාවේදී ඇති වූ සිද්ධිය සම්බන්ධවයි

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
සභාව මඟින් මෙම ලිපිය යොමු කිරීම පිළිබඳව මාගේ ස්තූතිය පුද කරමි. මටත් ආනන්දරාජ් මැතිතුමාටත් වාචිකව තර්කයක් මතු වුණා. විවිධ අවස්ථා වලදී මෙසේ සිදුවෙලා තියෙනවා. පසුව අපි සමාදානය වෙලත් තියෙනවා. එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමා සමඟ මම කිසිම තර්කයකට ගියේ නැහැ. එතුමා ගැන කතා කළෙත් නැහැ. නමුත් මෙම ලිපියේ වාචික තර්කයක් යනුවෙන් සඳහන් කිරීම වැරැදි කරුණක්. මමයි ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමයි අතර වාචික තර්කයක් ඇති වුණේ නැහැ. ලිපිය වැරැදියි. ලිපිය සංශෝධනය කළ යුතුයි. අනෙක් කරුණු නිවැරැදියි.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා (එ.ජා.ප.)</u>**
ගරු සභාපතිතුමියනි මේ ලිපිය යොමු කළා නේද? යොමු කළ ලිපියේ සංශෝධන ගෙන එන්නේ කොහොමද? මෙම ලිපියේ වැරැදි සඳහන් වෙලා තියෙන බවට සඳහන් කර සත්‍ය කරුණු මතු කරමින් ගරු උප සභාපතිතුමා තමයි ලිපිය යොමු කරන්න ඕන.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සිද්ධියට අදාළ ගරු උප සභාපතිතුමා එකී මන්ත්‍රීතුමා සමග සමාදානයට යන්න පුළුවන් බව පවසනවා. එනිසා උප සභාපතිතුමා විසින්ම ලිපිය යොමු කරන්න.

ලිපි අංක 10 –
යොමුව - පළාත් පාලන සහකාර කොමසාරිස්
විෂය - 2021.12.13 දිනැති මහා සභාවේදී ඇති වූ සිද්ධිය සම්බන්ධ ලිපිය

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
කොමසාරිස්තුමාගේ ලිපියට අනුව විනයානුකූල කටයුත්තකට යන්න ඕන. මේ ලිපියත් සභා වාර්තාවත් අතර වෙනසක් තියෙනවා. ගරු ආණ්ඩුකාර තුමාගේ අවධානයට යොමුවන අවස්ථාවේදී සභා වාර්තාව සුදුසු නැති විය හැකියි.

**<u>ගරු. මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
ගරු සභාපතිතුමියනි මේ සම්බන්ධව විනයාණුකූලව කටයුතු කරන ලෙසට මමත් ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. එම ලිපියත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන්න.

**<u>ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ලිපියත් වාර්තාවත් එකම විදිහට තිබිලා තිබුණා නම් කමක් නෑ. වාර්තාව සකස් කිරීමේ සම්පූර්ණ වගකීම තියෙන්නේ ලේකම්තුමාට. වැරැදි පිළිබඳව අපි උපුටා දක්වන අවස්ථාවේදි එය නිවැරැදි කිරීමේ වගකීමත් පැවරෙන්නේ ලේකම්තුමාටයි. ලිපිය නිවැරැදිව තියෙනවා.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
මම පොලිස් පැමිණිල්ලේ පිටපතක් ලබාගෙන තියෙනවා. අධිකරණයේ නඩුවක් පැවරීමට අවශ්‍ය සියලු තොරතුරු ලබාගෙන තියෙනවා. රුපියල් 12,50000.00 ක වන්දි මුදලක් ඉල්ලමින් නඩුවක් පවරලා තියෙනවා. බ්‍රහස්පතින්දා අධිකරණයට යන්න සූදානම්. සභාවෙන් අවශ්‍ය කටයුතු සිදු නොවන්නේනම් වැඩි දුර කටයුතු සඳහා අවශ්‍ය සියලු කාර්යයන් මම අවසන් කරලා තියෙන්නේ.

ලිපි අංක 11 –
යොමුව - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අඹගමුව
විෂය - ගරු මන්ත්‍රීවරුනගේ රු.400,000.00ක් වටිනා ව්‍යාපෘති සම්බන්ධවයි

ලිපි අංක 12 –
යොමුව - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී\ මස්කෙළිය ප්‍රාදේශීය සභාව
විෂය - 2022 වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැලැස්ම සහා සම්මතය සඳහා ඉදිරිපත් කිරීම

**තීරණ අංක 03**
**2022 වර්ෂය සඳහා වන මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැලැස්ම සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.**

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
මූදල් කමිටු සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කිරිම

<u>**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
නල්ලතන්නියේ පිහිටි උප කාර්යාලයට වැඩි විදුලි බිලක් ගෙවලා තියෙන්නේ ඇයි?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
අපවිත්‍ර ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රය සඳහා වැඩි විදුලියක් වැය කරන්න සිදුවෙලා තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
සභාව පිටුපස කොටසේ පඩිපෙළවල් ඉදිකරලා තියෙනවා. ඊට සභාවේ අනුමැතිය ලබාගෙන තියෙනවාද?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
ඔව්, ගරු ආණ්ඩුකාරතුමාගේ මුදල් ප්‍රතිපාදන යටතේ සිදු කල ව්‍යාපෘතියක්. සභාවේ අනුමැතිය ලබාගෙන තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
මුල්‍ය කමිටු වාර්තාවේ වීදි ලාම්පු පිළිබඳ නිර්දේශයක් ලබාදීලා තියෙනවා. නඩත්තු කටයුතු ග්‍රාමීය සංවර්ධන කමිටු වලට ලබාදීමට නිර්දේශ කරලා තියෙනවා. මේ කෙසේද?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
සභාව මගින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහා අමාත්‍යාංශ මගින්ද වීදි ලාම්පු සවි කරලා තියෙනවා. එසේ සවි කරන ලද විදි ලාම්පු ග්‍රාම සංවර්ධන සංගම් වල භාරකාරත්වයට ලබාදීම සම්බන්ධව සාකච්ඡා කරලා තියෙනවා. නැවත නැවතත් ඒවා පළුදුවන නිසා සංගම් වලට භාරදීමට තීරණය කළා.

<u>**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
වීදි ලිම්පු අළුත්වැඩියා කිරිම සභාවේ රාජකාරියක් නේද? මෙවැනි නිර්දේශ ලබාදිම කෙතෙක් දුරට සාර්ථකදැයි දන්නේ නැහැ. කසළ කළමනාකරණය අපෙන් වතු පරිපාලනයට ලබාදිය නොහැකියි. පසුව ගැටළු මතු වෙනවා. සභාව යටතේ පවත්වා ගැනීම සුදුසුයි.

<u>**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>

වතු ප්‍රදේශ වලට ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධන කටයුතු සිදුකළ හැකි බවට සංශෝධන ගෙනත් තිබුණද මෙවැනි කාරණා වලදී අප පසුබට වෙලා තියෙනවා. සභාව මගින් සවි කරන ලද විදි ලාම්පු සභාව මගින්ම නඩත්තු කිරිම තමයි සුදුසු.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාව මගින් සවි කරන ලද විදි ලාම්පු සභාවෙන් නඩත්තු කළ හැකියි. අමාත්‍යාංශ මගින් සවි කරන ලද ඒවා සහ සියලුම දේවල් නඩත්තු කිරිම අමාරුයි. විදුලිබල මණ්ඩලයෙත් මේ පිළිබඳව ගැටළු තියෙනවා.

වීදි ලාම්පු නඩත්තු කළ යුත්තේ සභාවෙන්ම තමයි. විදි ලාම්පුව පළුඳු වූ නිසා එය ලබාදුන් ඇමතිතුමාගෙන් නැවත ඉල්ලන්න බැහැ නේද? ලේකම්තුමාගේ පාලනයෙන් සභාව පවත්වාගෙන යනවිට මෙම කරුණ නිසා ගැටළු මතු වෙනවා. සංගම්වලට ලබාදිම සුදුසු නැහැ.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාවෙන් දිගටම නඩත්තු විය යුතු නම් ඒ සඳහා ද සභාවේ අනුමැතිය ලබාදිය යුතුයි.

<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
මේ කාර්යය අනිවාර්යෙන්ම සභාව මගින් සිදුකළ යුතුයි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාවේ කාලය අවසන් වූ පසු ලේකම්තුමාගේ පාලනය යටතේ සභාව පවත්වාගෙන යන අවස්ථාවේදී කුමන අනුමැතියෙන්ද වීදි ලාම්පු ලබා ගත්තේ කියන ප්‍රශ්නයක් මතු වෙනවා නේද?

<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන භාවිතා කර තිබුණා නම් එය සභාව යටතේ ඇති කරුණක් නේද? ඒ සඳහා නැවතත් අනුමැතියක් ලබා ගත යුත්තේ ඇයි.
(මෙම කාරණාව පිළිබඳව දීර්සව සාකච්ඡා කරන ලදී)

<u>ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
වතු පරිපාලන මගින් අක්කර බදු ගෙවනවා නම් පෞද්ගලික පුද්ගලයෙකු බදු ගෙවිමට අවශ්‍ය නැති බවට ලිපියේ කොටසක සඳහන් කරලා තියෙනවා. සියලුම වතුවල අක්කර බදු ගෙවනවාද? නැහැනේ?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ගෙවනවා.

<u>ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
වතු පරිපාලනය අක්කර බදු වශයෙන් සුළු මුදලක් ගෙවමින් වතු වලට ලැබෙන සංවර්ධන කටයුතු වලින් බැහැර කරනවාට වඩා පරිපාලනය විසින් අක්කර බදු නොගෙවා සිටිම හොඳයි. පෞද්ගලිකවම ජනතාව බදු ගෙවනවානම් ඔවුන්ට සේවාව ලබාගත හැකියි නේද? නැතිනම් වතු පරිපාලනය විසින් බදු ගෙවන නිසා අපට වීදි ලාම්පු ලබා දෙන්න කියලා ඉල්ලන්න පුළුවන්. එනිසා මේ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කළ යුතුයි.

<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>
ගව මස් කඩය අළුත්වැඩියා කිරීම සඳහා යෝජිත ඇස්තමේන්තුවක් මූල්‍ය කමිටුවට ඉදිරිපත් කර තියෙනවා.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>

ගව මස් කඩය අපි අළුත්වැඩියා කර දුන්නේ නැති නිසා තමයි, මෙවර පළමුවෙනි වතාවට ඒ අය ටෙන්ඩර් ලබා ගත්තේ නැති බවට ප්‍රකාශ කරල තියෙනවා. අපි අනිවාර්යෙන් අළුත්වැඩියා කර දිය යුතුයි.

<u>**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**</u>
සභාව සඳහා වූ ගොඩනැගිල්ලක් පිළිබඳව සුළු මොහොතකට පෙර ලිපියක් ඉදිරිපත් කළා. එම ගොඩනැගිල්ල ඉදිකිරිමේදි ගව මස් කඩය ඉවත් කරනවාද?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
ඉවත් කරනවා. වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේදි ගව මස් කඩයක් සඳහා කොටසක් ලබා දෙනවා.

<u>**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
මෙවර ටෙන්ඩර් එකේදි විවිධ ගැටළු මතුවෙලා තියෙනවා. තොරතුරු පිටතට ගිහිල්ලා. ඒ නිසා අනාගතයේදී මෙවැනි දේවල් අවධානයට ලක් කරමින් කටයුතු සිදු කරන්න.
(මෙම අවුරුද්දේ ටෙනඩර් පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් සිදු විය.)

<u>**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
ගවමස් කඩය සඳහා වූ යෝජිත ඇස්තමේන්තුව වැඩියි. නව පොදු වෙළඳ සංකිර්ණයක් ඉදිකළායින් පසුව ගවමස් කඩය ඉවත් කරන්නයි යන්නේ. ඒ නිසා වෙනත් ස්ථානයකට කඩය මාරු කරන්න. එසේත් නැතිනම් වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් ගන්න.

<u>**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
ගව මස් කඩය අළුත්වැඩියා කරනවාට වඩා මීට පෙර මම කියපු ස්ථානයේම ගව මස් කඩය සහ එළු මස් කඩය ඉදි කරන්න පුළුවන් නේද?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
එහෙම කරනවානම් මිට වඩා වියදම් කළ යුතු වෙනවා. වෙළඳ සංකිර්ණයක් ඉදිකරන නිසා එහි ගව මස් එළු මස් කඩ සඳහා ස්ථාන වෙන් කරනවා.

<u>**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
අපේ කාර්යාලය සම්බන්ධව දැන් තමයි කතා කළේ. රාජ්‍ය ඇමතිතුමා, අවධානය සඳහා තමයි ලේකම්තුමාට යොමු කරලා කියෙන්නේ. ඒක මුදල් වෙන් කරලා හදලා ඉවර වෙන්න කලින් සේරම ඉවරයි. සභාවත් සමහර වෙලාවට ඉවර වෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා මේක පූර්ණ අළුත්වැඩියාවක් කරනවානම් ඒ බිල්ඩිම කඩන්නැතිව ඉන්න ඕන. ඒක කඩනවානම් අළුත්වැඩියා කර්න්නැතිව වෙනත් ක්‍රමයකට යන්න ඕන

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
ඔවුන් අපට විශාල ටෙන්ඩර් මුදලක් ගෙවනවා. එනිසා එම අළුත්වැඩියා කටයුතු අපි සිදුකර දිය යුතුයි.

<u>**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
අපි එසේ අළුත්වැඩියා කටයුතු සිදුකර දුන්නා කියලා ඒ අය ජනතාවට අඩු මිලට මස් ලබා දෙන්නේ නැහැ. මේ වතාවේ වැඩි මුදලක් ලබාගෙන තියෙනවා නම් වෙනයම් විකල්ප ක්‍රියා මාර්ගයකට යන්න.

<u>**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**</u>
පළමුව මස් කඩයේ සිටින අයට සෞඛ්‍ය පුරුදු පිළිපදින්න කියලා කියන්න.

<u>**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>

පාසල් සිසුන් එම මාර්ගයේ ගමන් කරන නිසා කඩේට තිරයක් සවි කරන ලෙසට මම මීට පෙර කියලා තියෙනවා. ඒ වගේම ටෙන්ඩර් මුදල වැඩි කළොත් මස් මිලත් වැඩි වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මුදල් කමිටු වාර්තාව නිවරැදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**2022.01.07 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව**

**කාරණා අංක 01**
RD – 1231 ට්‍රැක්ටර් රථය සේවා කිරීම, ටේලර් රථයේ වැල්ඩින් කටයුතු හා ටේලරයේ පින්තාරු කටයුතු සඳහා අනුමැතිය ඉල්ලා කමිටුවට ලිපියක් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 04**
**ඉහත සඳහන් කල කටයුතු සඳහා මිල ගණන් කැඳවීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 02**
මස්කෙළිය ගව මස් කඩයේ අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා වන ඇස්තමේන්තුව කමිටුවට ඉදිරිපත් කරන ලදී. (152767.62)

**තීරණ අංක 05**
**මස්කෙළිය ගව මස් කඩයේ අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා කමිටු නිර්දේශය මත ගරු කේ.සුරේෂ්කුමාර් මැතිතුමා හැර අනෙකුත් සියළුම ගරු මන්ත්‍රීවරුන් විසින් තීරණය කරන ලදී.**

**කාරණා අංක 03**
ZB – 0394 අංක දරණ කම්පැක්ටර් රථය සඳහා අවශ්‍ය බැටරියක් සහ ටයර් ලබා ගැනීම අවශ්‍ය බව සඳහන් කරමින් ලිපියක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 06**
**ZB – 0394 අංක දරණ කම්පැක්ටර් රථය සඳහා අවශ්‍ය බැටරියක් සහ ටයර් ලබා ගැනීම සඳහා තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මිලදී ගනීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 04**
2021 වර්ෂයේ පැවැති කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් ටෙන්ඩර්කරුවන්ට සහනයක් ලබා දීම සම්බන්ධයෙන් විෂය ලිපිකරු විසින් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 07**
**ටෙන්ඩර්කරුවන් වෙත සහනයක් ලබා දීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 05**
කාර්යාලයට අවශ්‍ය පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර ලබා ගැනීම සඳහා විෂය ලිපිකරු විසින් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 08**
**ඒ අනුව අදාළ පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර සඳහා මිල ගණන් කැඳවීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 06**
කාර්යාලයේ භාවිතා කරන නිල මුද්‍රා සියල්ලම මේ වන විට ගෙවී ගොස් ඇති බැවින් නව නිල මුද්‍රා සකස් කිරීම සම්බන්ධයෙන් ලිපියක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 09**
**නව නිල මුද්‍රා සකස් කිරීම සඳහා කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 07**
කාර්යාලයට අවශ්‍ය නාම පුවරුවක් සකස් කර ගැනීම සම්බන්ධයෙන් ලිපියක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 10**
**ඒ සඳහා අවශ්‍ය මිල ගණන් කැඳවීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 08**
මස්කෙළිය මහජන පුස්තකාලයට සහ අප්කට් කියවීම් ශලාවට අවශ්‍ය පුවත්පත් ලබා ගැනීම සම්බන්ධයෙන් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 11**
**ඒ සඳහා අවශ්‍ය පුවත්පත් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**කාරණා අංක 09**
පසුගිය සභාවේදී සාකච්ඡා කල ටෙන්ඩර් කිරීම් සම්බන්ධයෙන් මෙම කමිටුවේදී සාකච්ඡා විය. මේ සඳහා අවශ්‍ය තොරතුරු ලේකම්තුමා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**කාරණා අංක 10**
Woship ව්‍යාපෘතිය මගින් අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින මකර තොරණ පොදු වැසිකිළි පද්ධතිය පෞද්ගලික ආයතනයක් මගින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කමිටුවේදී සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 12**
**පසුගිය වන්දනා සමයේ මෙන් මකර තොරණ වැසිකිළි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු නිම කිරීමෙන් පසුව බැතිමතුන් සඳහා නොමිලේ පහසුකම් සපයා දීම සඳහා අවසන් වරට මකර තොරණ වැසිකිළි පද්ධතිය ලබා දුන් ටෙන්ඩර් මුදල සභාවට ගෙවීමේ පදනම මත වැසිකිළි පද්ධතියේ කටයුතු පවත්වාගෙන යාමට පෞද්ගලික ආයතනයක ලබා දීමට කමිටු නිර්දේශය මත සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ඊළඟට 2022 වර්ෂය සඳහා වූ කමිටු සාමාජිකයින් පත් කිරීම.

2022 වර්ෂයේ සභාවේ කමිටු සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් පත් නොකරන ලෙස ඔවුන් විසින් දන්වා සිටින ලදී.

1. ගරු උප සභාපති පී.පී,ප්‍රදීපන් මැතිතුමා
2. ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා
3. ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා
4. ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා
5. ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා
6. ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා
7. ගරු මන්ත්‍රී ඒ.රවීන්ද්‍රරාජා මැතිතුමා

**මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

| අනු අංකය | කමිටුව සඳහා පත්වූ ගරු මන්ත්‍රීතුමාගේ/ තුමියගේ නම | යෝජනා කල මන්ත්‍රීවරුන් | ස්ථිර කලමන්ත්‍රී වරුන් |
|---|---|---|---|
| 01 | එස්.සුරේෂ්කුමාර් | පී.ආනන්දරාජ් | කේ.ජී.කේ.පෙරේරා |
| 02 | ටී.වසන්තකුමාර් | එස්.සුරේෂ්කුමාර් | කේ.නිත්‍යානන්දන් |
| 03 | කේ.යෝගේන්ද්‍රන් | කේ.නිත්‍යානන්දන් | ටී.වසන්තකුමාර් |
| 04 | ඒස්.ඒ.දිසානායක | කේ.එල්.ඒ.රංජනී | ටී.වසන්තකුමාර් |
| 05 | කේ.එල්.ඒ.රංජනී | ඒස්.ඒ.දිසානායක | කේ.ජී.කේ.පෙරේරා |
| 06 | පී.ආනන්දරාජ් | එස්.සුරේෂ්කුමාර් | කේ.නිත්‍යානන්දන් |
| 07 | කේ.නිත්‍යානන්දන් | එස්.සුරේෂ්කුමාර් | කේ.එල්.ඒ.රංජනී |

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

| අනු අංකය | කමිටුව සඳහා පත්වූ ගරු මන්ත්‍රීතුමාගේ/ තුමියගේ නම | යෝජනා කල මන්ත්‍රීවරුන් | ස්ථිර කලමන්ත්‍රී වරුන් |
|---|---|---|---|
| 01 | කේ.ජී.කේ.පෙරේරා | එස්.සුරේෂ්කුමාර් | කේ.එල්.ඒ.රංජනී |
| 02 | ටී.වසන්තකුමාර් | පී.ආනන්දරාජ් | කේ.නිත්‍යානන්දන් |
| 03 | ඒස්.ඒ.දිසානායක | එස්.සුරේෂ්කුමාර් | කේ.එල්.ඒ.රංජනී |
| 04 | කේ.එල්.ඒ.රංජනී | කේ.නිත්‍යානන්දන් | කේ.ජී.කේ.පෙරේරා |
| 05 | කේ.යෝගේන්ද්‍රන් | කේ.එල්.ඒ.රංජනී | කේ.ජී.කේ.පෙරේරා |

**තාක්ෂණ සේවා කමිටුව**

| අනු අංකය | කමිටුව සඳහා පත්වූ ගරු මන්ත්‍රීතුමාගේ/ තුමියගේ නම | යෝජනා කල මන්ත්‍රීවරුන් | ස්ථිර කලමන්ත්‍රී වරුන් |
|---|---|---|---|
| 01 | ඒස්.ඒ.දිසානායක | එස්.සුරේෂ්කුමාර් | කේ.එල්.ඒ.රංජනී |
| 02 | කේ.ජී.කේ.පෙරේරා | කේ.එල්.ඒ.රංජනී | කේ.යෝගේන්ද්‍රන් |
| 03 | කේ.යෝගේන්ද්‍රන් | කේ.ජී.කේ.පෙරේරා | ඒස්.ඒ.දිසානායක |

**පරිසර හා පහසුකම්**

| අනු අංකය | කමිටුව සඳහා පත්වූ ගරු මන්ත්‍රීතුමාගේ/ තුමියගේ නම | යෝජනා කල මන්ත්‍රීවරුන් | ස්ථිර කලමන්ත්‍රී වරුන් |
|---|---|---|---|
| 01 | කේ.නිත්‍යානන්දන් | එස්.සුරේෂ්කුමාර් | පී.ආනන්දරාජ් |

| | | | |
|---|---|---|---|
| 02 | කේ.ජී.කේ.පෙරේරා | කේ.නිත්‍යානන්දන් | එස්.සුරේෂ්කුමාර් |
| 03 | කේ.යෝගේන්ද්‍රන් | කේ.නිත්‍යානන්දන් | ටී.වසන්තරාජ් |
| 04 | කේ.එල්.ඒ.රංජනී | කේ.නිත්‍යානන්දන් | කේ.යෝගේන්ද්‍රන් |

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ඊළඟට ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියනි, මම යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා. එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා නෑ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හත්වෙනිදා යෝජනාව ඉදිරිපත් කරලා තියෙනවා. ගරු මන්ත්‍රී එස් සුරේෂ් කුමාර් මැතිතුමා හයවෙනිදා යෝජනාව ඉදිරිපත් කරලා තිබුණා. කාලවේලාව මදි නිසා ඒවා න්‍යාය පත්‍රයට ඇතුලත් කළේ නැහැ.

**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
හොඳයි ගරු සභාපතිතුමියනි, එහෙනම් මට දැනුම් දීමක් ලබා දිය යුතුයි නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
දින හතකට පෙර ඔබතුමා ලබා දුන්නේ නැහැනේ. න්‍යාය පත්‍රය සක්ස් කරලා මුද්‍රණය කරලත් අවසන්.

**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
එසේනම් මගෙන් යෝජනාව ලබා ගන්නේ නැතිව ඉන්න තිබුණා නේද?

**ගරු මන්ත්‍රී පී,ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ඔබතුමිය මට පෙර දැනුම්දීමක් නොකර මාගේ යෝජනාව ප්‍රතික්ෂේප කරලා තියෙනවා. මමත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙක්. මාව අපහාසයට ලක්කරලා තියෙනවා. මෙම සභාවේ සිදුවෙන බොහෝ හොඳ දේවල් වලට මම ඉදිරිපත්වෙලා ඔබතුමියට සහය ලබා දීලා තියෙනවා. මට කුමන රාජකාරියක් තිබුණත් මූල්‍ය කමිටු රැස්විමට මම වෙලාවට එනවා. මූල්‍ය කමිටු රැස්වීමේදි බොහෝ දේවල් මම මතක් කරලා දීලා තියෙනවා. එසේ තිබියදී මාව පළි ගැනීමේ අරමුණින් ඔබතුමිය මෙය ප්‍රතික්ෂේප කරලා තියෙනවා. මේ වගේ සිදුවීම් දෙකක් සිදුවෙලා තියෙනවා. සභා රැස්විම් දිනය මට දැනුම් දුන්නානම් වෙලාවට මගේ යෝජනාව මා ලබා දෙනවා. මට දැනුම් දීලා තිබුණේ නැහැ. මගේ යෝජනාව ඉවත් කිරිම පිළිබඳව මට ලිඛිතව ලබා දිය යුතුයි.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමා ලේකම්තුමාටත් යෝජනාවේ පිටපතක් ලබා දීලා තියෙනවා. නමුත් එතුමාගේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් නොකිරීම පිළිබඳව දැනුම් දීලා නැහැ. සූදානම් කර තිබු මාධ්‍ය සාකච්ඡාවටත් විශාල බලපෑමක් සිදුවෙලා තියෙනවා. මේවා මම හෙලා දකිනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ගරු උප සභාපතිතුමනි, මෙතුමාගේ යෝජනාව පමණක් නොවෙයි ගරු මන්ත්‍රී එස්.සුරේෂ් කුමාර් මැතිතුමාගේ යෝජනාවත් ප්‍රමාද වී ලැබුන නිසා න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

යහ පාලනය රජය සමයේ දී සභාව ආරම්භ කළ අවස්ථාවේ ලේකම්තුමාව ස්ථානමාරු කළ යුතුයි යනුවෙන් සඳහන් කළද වහාම එවකට පිහිටි රජයට අපගේ නායකයින් මගින් සම්බන්ධ වී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමග සාකච්ඡාකර මම අවශ්‍ය කටයුතු සිදු කළා. යෝජනාව භාර ගැනීම ලේකම්තුමාගේ රාජකාරියක් නේද? එය භාර නොගන්නා බවට ලේකම්තුමා ප්‍රතික්ෂේප කිරීම වැරැදියි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො.)</u>**
මාගේ යෝජනාවන භාර ගැනීමත් දිගටම ප්‍රතික්ෂේප කරලා තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ප්‍රමාද වී ලැබුන කිසිම යෝජනාවක් ඇතුලත් කරලා නැහැ. වෙන කිසිම චේතනාවක් නැහැ. ඊළඟට ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවේ මූල්‍ය තත්වය හේතුකොටගෙන ගරු සභාපතිතුමියගේ සහ අනෙකුත් නිලධාරීන්ගේ ඉන්ධන වියදම් සහ වෙනත් දීමනා පිළිබඳ යෝජනාවයි. ගරු සභාපතිතුමියගේ වාහනය සඳහා මසකට රුපියල් 90000.00 ක් ලබා දෙනවා. ඉන්ධනත් ලබා දෙනවා. රියදුරුවරයෙකුත් ලබා දෙනවා. මේ පිළිබඳව මෑතකදි සියලුම රාජ්‍ය ආයතන වල වියදම් අඩු කරන ලෙසට ගරු මුදල් අමාත්‍යතුමා පවසලා තිබුණා. ඒ අනුව තමයි මම කියන්නේ සභාපතිතුමිය සඳහා සභාවෙන් විශාල මුදලක් වැය කරනවා. මේ අතර තවත් රුපියල් 10000.00 ක් අතිරේක වියදමට ලබා දෙනවා. ගරු මුදල් අමාත්‍යතුමා පවසන පරිදි යම්කිසි වියදමක් ගරු සභාපතිතුමිය අඩු කරගන්න අවශ්‍යයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
කිසිම සභාවක නැති අළුත් දෙයක් නෙවෙයි මේක. සභාපතිවරයෙකුට තියෙන වරප්‍රසාද තමයි මමත් අත් විඳින්නේ. ඒකත් වැඩියෙන් නෙවෙයි. මට මාසිකව ඉන්ධන ලීටර් 600 කට සීමා කරලා තියෙනවා. මම ඒ ලීටර් 600 ම භාවිතා කරන්නෙත් නැහැ. අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් ප්‍රවාහන, දුරකථන වියදම් ගෙවනවා. මම දුර ගමන් යන අවස්ථාවලදී මගේ කෑමට සහ රියදුරු මහතාගේ කෑමට මුදල් අවශ්‍යයි. මේ සමග මෙම කරුණ පිළිබඳව සභා රැස්වීම් තුනකදි සාකච්ඡා කරලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
හොඳයි, පසුගිය මාස හයකදි ඇඳිරි නීතිය යොදා තිබුණා. ඒ වෙලාවෙත් විශාල මුදලක් මේ සඳහා වැය කරලා තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු ආණ්ඩුකාරතුමා, පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා වැනි අය ඒ අවස්ථාවලදීත් රැස්වීම් කීයකට කැඳවලා තියෙනවද කියලා බලන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඉන්ධන සඳහා මාසිකව කොපමණ මුදලක් වැය කරනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සඳහා වු පිළිතුර ලබන රැස්වීම් වාරයේදී ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
යෝජනාව  කළින්ම ඉදිරිපත් කරලා තියෙනවා.එසේනම් යෝජනාවේ ඇති කරුණු සඳහා පිළිතුරු දීමට සූදානම් වෙලා එන්න අවශ්‍යයි නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියගේ වරප්‍රසාද වලට සහ පහසුකම් වලට අපි කිසිම බාධාවක් කරලා නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ කරුණු පිළිබඳව කිහිප වතාවක්ම ප්‍රශ්න කරලා තියෙනවනේ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මම මේ ගැන කතා කරන්න හේතුව, මහ ජනතාවගේ ඡන්දයෙන් පත්වෙලා අපි මෙහාට ඇවිල්ලා තියෙනවා.අපි යම්කිසි අවශ්‍යතාවයකට සභාවට ආවොත් එසේ නැතිනම් අපට ඡන්දය දීපු මහජනතාව සභාවට ආවත් අපට කතා කරන්න සිදුවෙලා තියෙන්නේ එළියෙ ඉඳලා. උප සභාපතිතුමාටත් කාමරයක් තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
කාර්යාලයේ ඉඩ තියෙන්නේ එපමණයි. වැඩිපුර මේස පුටු දාන්න ඉඩ නැහැ. පසුගිය සතියේදී මම පළාත් පාලන දෙපාර්තමේන්තුවට ගිය අවස්ථාවේදී නව ගොඩනැගිල්ල ඉදි කරන තෙක් දැනට ඇති කාර්යාලය ටිකක් පුළුල් කරන්න පුළුවන්ද කියලා ඇහුවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අලුතෙන් නිලධාරින් කිහිප දෙනෙක් ඇවිල්ලා ඉන්නවා. ඔවුන්ට සියලුම පහසුකම් සලසලා දීලා තියෙනවා. අපි නින්දාවට පත්වෙලා තියෙනවා. එදා මම ඔබතුමිය හමුවීම සඳහා පැයක පමණ කාලයක් එළියේ ඉඳගෙන සිටියා. ඔබතුමිය වතු අධිකාරි වරයෙකු සමග සාකච්ඡා කරමින් සිටියේ. මම දුරකථනයෙන් සම්බන්ධ වුණා. ඔබතුමිය පිළිතුරු දුන්නේ නැහැ. නමුත් මන්ත්‍රී26රුන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුයි.
**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔබතුමා දුරකථනයෙන් සම්බන්ධ වන අවස්ථාවේ විනාඩි 5ක් ඉන්න කියලා කිව්වා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මස් කඩ අණත්වැඩියා කරනවා. ඒ විදිහට මුදල් කමිටුවට ඉදිරිපත් කරලා ලක්ෂ 3ක් පමණ වැය කරලා ගරු මන්ත්‍රීවරුන්ට වාඩිවෙලා වැඩ කරන්න තැනක් ඉදිකරලා දුන්නොත් මොකද? මේක විශාල ප්‍රශ්නයක්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂකුමාර් මැතිතුමා (ලං.ක.කො.)</u>**
ගරු උප සභාපතිතුමාගේ කාමරය හැමවෙලේම වහලා තමයි තියෙන්නේ. හැමදාම සභාවට එන මන්ත්‍රීවරුන්ට එම ස්ථානය ලබා දෙන්න. සභාවට අපි වශාල මුදල් ප්‍රතිපාදන ගෙන එනවා. සභිකයින්ට ලැබෙන ගමන් වියදම් ඉතා අඩුයි. ගරු උප සභාපතිතුමාට මාසයකට රු.5000ක් ලබා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, ඔබතුමිය කවුරුහරි හමුවෙන්න ආවොත් එයාව එළියේ තියලා හම්බවෙන්න බෑනේ. ඒ වගේම තමයි අපිටත්. අපි ලැජ්ජ වෙනවා. අපි කාර්යාලය ඉදිරිපිට කොඩි ඔසවා ඇති කණු අසළ වාඩිවෙලා කතා කර කර සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො.)</u>**
ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාවෙන් උප සභාපතිතුමාට ලබා දී තිබෙන කාමරය පිළිබද සාකච්ඡා වුණා. සභාව ආරම්භ කල මුල්දින වල මට තිබෙන රාජකාරී මොනවාද කියලා ගරු සභාපතිතුමියගෙන් ඉල්ලා තිබුණා. ගරු සභාපතිතුමිය දෙවතාවෙක් විදෙස් ගත වෙලා සිටි කාලය තුළ සභාපතිතුමියගේ රාජකාරීය මා විසින් හරියටම ඉටු කලා. සභාපතිතුමිය නොමැති වලොවට තමයි මට සභාවට ඇවිත් සභාපතිතුමියගේ රාජකාරීය ආවරණය කරන්න පුළුවන්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
හැම සභාවකම සභාපතිවරුන්ට ලැබෙන වරප්‍රසාද තමයි මටත් ලැබෙන්නේ. නමුත් ඇයි මේ සභාවෙන් පමණක් මට දෙන වාහන,ඉන්ධන, ගමන් වියදම් පිළිබඳව නිතරම කතා කරන්නේ? මේ ගැන නිතරම අහන එක ගැන මට කණගාටුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ලබන මුදල් කමිටුවේදී මන් ඉල්ලීමක් කරනවා ගරු මන්ත්‍රීවරුන් සඳහා කාමරයක් ඉදිකර දීමට මුදල් කමිටුවේ නිර්දේශය කල යුතුයි කියලා.

**<u>ගරු මන්ත්‍රී උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො.)</u>**
සභාවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා වෙනම ස්ථානයක් වෙන් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අප සභාවට පැමිණ සිටින පරිපාලනයට සම්බන්ධ නිලධාරීන් රැස්වීමකින් ගරු මන්ත්‍රීවරුන් වෙත හඳුන්වලා දෙන්න. කවුරුන්ද කියලා දැනුවත් නැතුව සමහර අවස්ථාවල ගැටළු ඇති වෙනවා. වරිපනම් වැඩි නොකල යුතුයි කියා ලිපියක් ඇවිත් තියෙනවා. ඒ වගේම මස් කඩ මාළු කඩ සඳහා ටෙන්ඩර් මුදල වැඩි කරලා තියෙනවා. මේ නිසා පාරිභෝගිකයන් අපහසුතාවයට පත් වෙන්න හොඳ නැහැ. මේ සම්බන්ධයෙන් කොමසාරිස්තුමාත් අවධානය යොමු විය යුතුයි කියලා තමයි යෝජනාව ඉදිරිපත් කළේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
හැම අවුරුද්දෙම ටෙන්ඩර් මුදල කලින් වසරට පෙර වැඩි කරලා තමයි දාන්න ඕනේ. අනිත් යෝජනා ඊළඟ සභා වාරයේදී න්‍යාය පත්‍රයට ඇතුලත් කරනු ලැබේ. මේ සමග අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

**ස්තූතියි.**
**ආයුබෝවන්.**

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.